# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 01යි. මුළු ලකුණු 80කි.**

★ බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. 10 **ශ්‍රේණිය සඳහා 50% ක්ද**, 11 **ශ්‍රේණිය සඳහා 50% ක් ද**, වශයෙන් බර තැබෙන ආකාරයට ප්‍රශ්න සකස් කරන අතර ඒ තුළ **80%ක් ශ්‍රී ලංකා ඉතිහාසය** සම්බන්ධ නිපුණතා සඳහා ද, **20% ක් ලෝක ඉතිහාසය** හා සම්බන්ධ නිපුණතා සඳහා බර තැබේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 80යි.

PAST PAPERS WIKI

## 2.1.2. I පත්‍රය

**1.** 'වංසත්ථප්පකාසිනී' කවර වංසකථාවකට ලියන ලද ටීකාවක් ද?
(1) දීපවංසය (2) මහාවංසයේ මුල් කොටස
(3) ථූපවංසය (4) බෝධිවංසය

**2.** පුරාණ කාලයට අයත් සාහිත්‍ය, ආගමික තොරතුරු හා වංසකථා ලියැවී ඇත්තේ,
(1) පුස්කොළ පොත්වල ය. (2) ගල් පුවරු මත ය.
(3) කටාරම්වල ය. (4) රන් සහ තඹපත්වල ය.

**3.** තම අත්දැකීම් ඇසුරෙන් උඩරට රාජ්‍යය පිළිබඳව තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් ලියා ඇත්තේ,
(1) බැල්ඩියස් ය. (2) රිබෙයිරෝ ය.
(3) රොබට් නොක්ස් ය. (4) ක්වේරොස් පියතුමා ය.

**4.** පොහොය දිනවල වෙළෙඳාම් කළ අයට දඩ නියම කළ බවට තොරතුරු ලැබෙන මූලාශ්‍රය මින් කුමක් ද?
(1) මිහින්තලා පුවරු ලිපිය (2) වේවැල්කැටිය ශිලා ලිපිය
(3) ගල්පොත ශිලා ලිපිය (4) සොරබොරවැව ටැම් ලිපිය

**5.** පුරවැසියකු ලෙස ඉතිහාස දැනුම වඩාත් ම ඵලදායි ලෙස භාවිත කළ යුතු වන්නේ,
(1) අතීත ශ්‍රී ලාංකික ශ්‍රී විභූතිය හැදෑරීම සඳහා ය.
(2) පැරණි තාක්ෂණික දැනුම නවීකරණය කර භාවිතයට ගැනීම සඳහා ය.
(3) අතීතයේ කළ වැරදි නැවත සිදු නොකිරීම සඳහා ය.
(4) අතීතය තුළින් වර්තමානය අවබෝධ කරගෙන අනාගතය හැඩගසා ගැනීම සඳහා ය.

**6.** ශ්‍රී ලංකාවේ ජාතික උරුමයක් වූ පුරාවස්තු රැක ගැනීම කළ යුතු වන්නේ මින් කවර කරුණක් නිසා ද?
(1) මතු පරපුරට පෙන්විය යුතු නිසා ය.
(2) ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කිරීමට හේතු වන නිසා ය.
(3) සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට හේතු වන නිසා ය.
(4) අතීත පාලකයන්ගේ කටයුතු ගැන අවබෝධයක් ලබා ගත හැකි නිසා ය.

**7.** ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් ලැබී ඇති පතිරාජවෙල ප්‍රදේශයේ ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුව කාල නිර්ණය අනුව වසර,
(1) එක් ලක්ෂ විසිපන් දහසක් පැරණි ය. (2) අසූ දහසක් පැරණි ය.
(3) තිස්අට දහසක් පැරණි ය. (4) විසිඅට දහසක් පැරණි ය.

**8.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ජීවන රටාව පිළිබඳව තොරතුරු ලබා ගැනීමට ඉවහල් වන සාධක බොහොමයක් ලැබී ඇති ස්ථානයක් ලෙස සැලකෙනුයේ,
(1) රිටිගල ය. (2) කදුරුගොඩ (කන්දරෝඩේ) ය.
(3) පාහියන්ගල ය. (4) කතරගම ය.

**9.** ශ්‍රී ලංකාවේ යකඩ භාවිතය පිළිබඳව මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ,
(1) ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ය. (2) පූර්ව ඓතිහාසික යුගයේ දී ය.
(3) මුල් ඓතිහාසික යුගයේ දී ය. (4) ඓතිහාසික යුගයේ දී ය.

**10.** දඩයමින් ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා, ගොවිතැන කෙරෙහි යොමු වීමට බලපෑ මූලික පරිසරාත්මක හේතුව මින් කුමක් ද?
(1) පසෙහි සාරවත් බව වැඩි වීම
(2) දඩයමට සුදුසු සතුන් හිඟවීම
(3) පැවති ශීත දේශගුණය වෙනස් වී උණුසුම් දේශගුණයක් ඇරඹීම
(4) ජන සංඛ්‍යාව වැඩි වීම හා ව්‍යාප්ත වීම

**11.** මුල් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ ජනාවාසවල ව්‍යාප්තිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට වැදගත් වන සාධකය මින් කුමක් ද?
(1) ගම් වැව්වල ව්‍යාප්තිය (2) ලෙන්වල පිහිටීම
(3) රතු-දුඹුරු පස්වල ව්‍යාප්තිය (4) තැනිතලා බිම්වල ව්‍යාප්තිය

**12.** පරුමකවරුන්ට රජයේ ඉහළ තනතුරු ලබා දී දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ රජතුමා වන්නේ,
(1) පණ්ඩුකාභය ය. (2) දේවානම්පිය තිස්ස ය. (3) දුටුගැමුණු ය. (4) වසභ ය.

PAST PAPERS WIKI

**13.** අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බවට ප්‍රබල සාධකයක් වන්නේ,
(1) පැරණි වෙදපොත් මෙරට භාවිතයේ පැවතීමයි.
(2) පුරාවිද්‍යාත්මක කැණීම්වලින් ශල්‍ය වෛද්‍ය උපකරණ හමුවීමයි.
(3) වෛද්‍යවරුන් ලෙස ප්‍රසිද්ධියට පත් රජවරු පිළිබඳව වංසකථාවල සඳහන් වීමයි.
(4) අතීත රෝහල් ගොඩනැගිලිවල නටබුන් හමුවීමයි.

**14.** ස්ථාන කිහිපයකින් ම අමුණු බැඳ දිගු දුරකට ඇළ මාර්ග මගින් ජලය ගෙනයාම සඳහා යොදා ගත් ගංගාව මින් කුමක් ද?
(1) මල්වතු ඔය (2) කලා ඔය (3) යාන් ඔය (4) මහවැලි ගඟ

**15.** තෙවරක් ම මෙරට පාලනය කළ රැජිනිය ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ මින් කවර තැනැත්තියක් ද?
(1) ලීලාවතී (2) කල්‍යාණවතී (3) සුගලා (4) චූල සීවලී

**16.** කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා තමාගේ ශිලා ලිපි බොහොමයක ම භාවිත කළ රාජ්‍යත්වය පිළිබඳ සංකල්පය මින් කුමක් ද?
(1) දේවත්ව (2) බෝධිසත්ව (3) පර්වතරාජ (4) චක්‍රවර්ති

**17.** අතීතයේ දී 'ගව්ව' යන මිනුම භාවිත කරන ලද්දේ,
(1) කාලය මැනීමට ය. (2) දුර මැනීමට ය. (3) බර මැනීමට ය. (4) වපසරිය මැනීමට ය.

**18.** 'දකපති' යනුවෙන් සෙල්ලිපි මූලාශ්‍රවල සඳහන් වන්නේ,
(1) ජල බද්දකි. (2) ධාන්‍ය බද්දකි. (3) මත්ස්‍ය බද්දකි. (4) තොටුපොළ බද්දකි.

**19.** පහත ප්‍රකාශ සලකන්න.
- නගර නිර්මාණය ජ්‍යාමිතික සැලසුම් ආකෘතියෙන් මිදී නිදහස් ස්වරූපයකට පරිවර්තනය වීම.
- නගර මහා පරිමාණ ස්වරූපයක් පෙන්නුම් නොකිරීම.

ඉහත ප්‍රකාශ හා සම්බන්ධ නගර යුගලය වන්නේ මින් කුමක් ද?
(1) අනුරාධපුරය හා පොළොන්නරුව
(2) අනුරාධපුරය හා දඹදෙණිය
(3) දඹදෙණිය හා යාපහුව
(4) පොළොන්නරුව හා කුරුණෑගල

**20.** ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහතින් දක්වා ඇත.
A – පන්සිය පනස් ජාතක කථා පොත සිංහලට පරිවර්තනය කිරීම
B – උඩරට සාමන්ත පාලක 'ජෝතිය සිටුවරයා' කැරැල්ලක් ඇති කිරීම
C – චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කිරීම
D – අරාබි ජාතික ඉබන් බතූතා ලංකාවට පැමිණීම

ඉහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව පෙළගැස්වූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?
(1) A, C, B හා D (2) C, A, D හා B (3) C, D, A හා B (4) D, C, A හා B

**21.** මහනුවර රාජධානිය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) රටේ ඉහළ ම පාලන හා අධිකරණ බලතල රජතුමා සතු විය.
(2) පාලන කටයුතු සිදු වූයේ සම්ප්‍රදාය හා පෙර සිරිතට අනුව ය.
(3) සමාජ සම්බන්ධතා හා විවාහ කටයුතු කුල ක්‍රමය අනුව සිදු විය.
(4) රටේ සියලු ම පුරවැසියන් නීතිය හමුවේ සමාන ලෙස සැලකිණි.

**22.** ශ්‍රී ලංකාවට පෘතුගීසීන් පැමිණෙන විට යාපනයේ සිටි පාලකයා කවුරුන් ද?
(1) සංකිලි (2) පරරාජසේකරම් (3) පුවිරාජපණ්ඩාරම් (4) එදිරිමාන්නසිංහම්

- පහත වගුවේ සඳහන් A සිට J දක්වා තොරතුරු ඇසුරින් **23** සහ **24** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රජතුමා | ස්ථානය | හමුදා ප්‍රධානියා |
|---|---|---|
| A - පළමුවන විමලධර්මසූරිය | D - රන්දෙනිවෙල | G - දියෝගු ද මෙලෝ |
| B - පළමුවන රාජසිංහ | E - දන්තුරේ | H - කොන්ස්තන්තීනු ද සා |
| C - දෙවන රාජසිංහ | F - මුල්ලේරියාව | J - පේරෝ ලෝපේස් ද සූසා |

PAST PAPERS WIKI

**23.** රන්දෙනිවෙල සටනට සම්බන්ධ වූ උඩරට රජතුමා සහ පෘතුගීසි හමුදා ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා G (2) B හා H (3) C හා H (4) C හා J

24. පළමුවන විමලධර්මසූරිය රජතුමා පෘතුගීසීන් සමග සටන් කළ ස්ථානය හා එහිදී පෘතුගීසි හමුදාව මෙහෙයවූ ප්‍රධානියා දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) D හා G (2) E හා H (3) E හා J (4) F හා G

25. රජතුමාට පුතෙකු නොසිටි විට බිසවගේ සහෝදරයාට රාජ්‍ය උරුමය හිමිකර දීමේ සම්ප්‍රදාය අනුගමනය කළේ පහත සඳහන් කවර වංශයකට අයත් පාලකයන් විසින් ද?

(1) මෝරිය (2) ලම්බකර්ණ (3) කාලිංග (4) නායක්කර්

26. ලන්දේසීහු උඩරට රජවරුන් සමග කටයුතු කිරීමේ දී බොහෝ දුරට ගැටුම් ඇතිකර ගැනීමෙන් වැලකී සිටීමට ප්‍රධාන හේතුව මින් කුමක් ද?

(1) උඩරට රජවරුන් අමනාප කර ගැනීම තම වෙළෙඳ කටයුතුවලට බාධාවක් විය හැකි නිසා
(2) උඩරට රජවරුන්ගේ යුධ ශක්තිය හමුවේ ලන්දේසි යුධ බලය දුර්වලව පැවති නිසා
(3) වියදම් අඩු කර ගැනීම ලන්දේසි ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණය වූ නිසා
(4) උඩරටට හමුදා යැවීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වූ නිසා

● පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරින් **27** සහ **28** යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – සර්ව ජන ඡන්දබලය
B – ජාතික රාජ්‍ය සභාව
C – ජනමත විචාරණය
D – සෙනෙට් සභාව
E – සමානුපාතික නියෝජන ක්‍රමය

27. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සම්බන්ධ තොරතුරු පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා E

28. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) B හා C (2) B හා D (3) C හා D (4) C හා E

29. ඉංග්‍රීසීන්ට, උඩරට යටත් කර ගැනීමේ ව්‍යාපාරයේ දී උපායශීලී ලෙස කටයුතු කිරීමෙන් දායකත්වයක් සැපයූ පුද්ගලයා ලෙස සැලකෙනුයේ,

(1) මේජර් හුක් ය. (2) ඇහැලේපොළ අදිකාරම් ය.
(3) ජෝන් ඩොයිලි ය. (4) රොබට් බ්‍රවුන්රිග් ය.

30. ශ්‍රී ලංකාවේ බිහි වූ පැරණිතම දේශපාලන පක්ෂය වන්නේ,

(1) ලංකා සමසමාජ පක්ෂයයි. (2) එක්සත් ජාතික පක්ෂයයි.
(3) ලංකා කොමියුනිස්ට් පක්ෂයයි. (4) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.

31. ශ්‍රී ලංකාවේ පිහිටි ගොවිජනපද කිහිපයක් පහත දැක්වේ.

A – ගල්ඔය B – මින්නේරිය
C – කන්තලේ D – මිනිපේ
E – ගිරිතලේ

ඉහත ගොවිජනපද අතුරෙන් ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර ආරම්භ කරන ලද ඒවා දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා E (2) B හා C (3) B හා D (4) C හා D

32. හෙන්රි ස්ටීල් ඕල්කොට්, අනගාරික ධර්මපාල, ආරුමුග නාවලර් හා සිද්දි ලෙබ්බෙ යන පුද්ගලයන්ගේ කටයුතුවල පොදු ලක්ෂණය වන්නේ,

(1) ආගමික හා අධ්‍යාපනික පුනරුදයේ මූලිකත්වය දැරීම ය.
(2) ශ්‍රී ලාංකික අතීත ශ්‍රී විභූතිය ලොවට පෙන්වීම ය.
(3) අමද්‍යප ව්‍යාපාරයේ මූලිකත්වය දැරීම ය.
(4) ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණ කිරීම ය.

33. මධ්‍යතන යුගයේ දී යුරෝපයේ ඇරඹි පුනරුදය නිසා විවිධ ක්ෂේත්‍රවල බොහෝ වෙනස්කම් සිදු විය. ලියනාඩෝ ඩා වින්චි ප්‍රසිද්ධියට පත්වූයේ මින් කවර ක්ෂේත්‍රයක ද?

(1) වෛද්‍ය විද්‍යාව (2) චිත්‍ර කලාව (3) දේශ ගවේෂණය (4) සාහිත්‍යය

PAST PAPERS WIKI

**34.** විවිධ සොයා ගැනීම් කරන ලද පුද්ගලයන් කිහිප දෙනෙකුගේ නම් පහත සඳහන් වේ.

A - සැමුවෙල් මෝර්ස්

B - රොබට් පුල්ටන්

C - හම්ෆ්‍රි ඩේවි

D - ගුග්ලි මාර්කෝනි

E - ජෝන් මැකඩම්

ඉහත පුද්ගලයන් අතුරෙන් කාර්මික විප්ලව සමයේ සන්නිවේදන ක්ෂේත්‍රය හා සම්බන්ධ සොයා ගැනීම් කරන ලද පුද්ගලයන් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) A හා C ය. (2) A හා D ය. (3) B හා E ය. (4) C හා E ය.

**35.** කාර්මික විප්ලවය නිසා වර්ධනය වූ සමාජ ප්‍රතිඵලයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) භාණ්ඩ හා සේවා, ලාභයටත් ඉක්මනටත් මහා පරිමාණයටත් සැපයීමට හැකිවීම

(2) බහුජාතික ව්‍යාපාර වර්ධනය වීමට පටන් ගැනීම

(3) නාගරීකරණයේ වර්ධනය වේගවත් වීම

(4) මූල්‍ය හා බැංකු සේවා පුළුල් වීමට පටන් ගැනීම

- පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/පද යුගල අධ්‍යයනය කර **36** සිට **38** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. යුද ගැටුම්
2. පරිසර දූෂණය

B – 1. නාසිවාදය
2. හිට්ලර්

C – 1. මාර්ෂල් සැලැස්ම
2. ඇමෙරිකා එක්සත් ජනපදය

D – 1. පළමුවන ලෝක මහා සංග්‍රාමය
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය

**36.** පළමුවැන්නේ වැඩි වීම දෙවැන්න ඉහළ යාමට හේතු වන බව පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**37.** පළමුවැන්නේ වර්ධනයත් සමග දෙවැන්නේ බලවත් වීම පෙන්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**38.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් **නොපෙන්වන** ප්‍රකාශ/පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

**39.** දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ දී කොළඹ හා ත්‍රිකුණාමලය යන නගරවලට ගුවන් ප්‍රහාර එල්ල කළ රට කුමක් ද?

(1) ඇමෙරිකා එක්සත් ජනපදය (2) ජර්මනිය

(3) ජපානය (4) ඉතාලිය

**40.** නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කළ දකුණු ආසියානු රාජ්‍ය නායකයා මින් කවරෙක් ද?

(1) මාෂල් ටිටෝ (2) ජවහර්ලාල් නේරු (3) අබ්දුල් ගමාල් නසාර් (4) ලී ක්වාං යූ

PAST PAPERS WIKI

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 02 | 21. | 04 |
| 02. | 01 | 22. | 02 |
| 03. | 03 | 23. | 03 |
| 04. | 04 | 24. | 03 |
| 05. | 04 | 25. | 04 |
| 06. | 02 | 26. | 03 |
| 07. | 01 | 27. | 02 |
| 08. | 03 | 28. | 04 |
| 09. | 02 | 29. | 03 |
| 10. | 03 | 30. | 01 |
| 11. | 01 | 31. | 03 |
| 12. | 03 | 32. | 01 |
| 13. | 02 | 33. | 02 |
| 14. | 04 | 34. | 02 |
| 15. | 01 | 35. | 03 |
| 16. | 04 | 36. | 01 |
| 17. | 02 | 37. | 02 |
| 18. | 01 | 38. | 04 |
| 19. | 03 | 39. | 03 |
| 20. | 02 | 40. | 02 |


වගුව 05

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 80කි.


I පත්‍රය සඳහා අවසන් ලකුණ $= 40 \times 2 = 80$

PAST PAPERS WIKI

2.1.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව



| විෂය ක්ෂේත්‍ර | ප්‍රශ්න සංඛ්‍යාව | පහසුතාව වැඩි ම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | පහසුතාව අඩු ම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | 32 | 8 - 91% | 26 - 11% |
| ලෝක ඉතිහාසය | 08 | 33 - 92% | 38 - 51% |




2016 වසර ඉතිහාසය I පත්‍රය සැකසීමේ දී ශ්‍රී ලංකා ඉතිහාසය කොටසට ප්‍රශ්න 32ක් ද ලෝක ඉතිහාසය කොටසට ප්‍රශ්න 08ක් ද ඇතුළත් වී ඇත. ලංකා ඉතිහාසයේ සමස්ත පහසුතාව 61.34%ක් හා ලෝක ඉතිහාසයේ සමස්ත පහසුතාව 67%ක් ද බව අනාවරණය වේ.

ශ්‍රී ලංකා ඉතිහාසය කොටසේ සමස්ත පහසුතාව කෙරෙහි 6 - 11 ශ්‍රේණිය දක්වා චිත්‍ර, බුද්ධ ධර්මය, සිංහල, ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය යන විෂයයන්වලින්, විෂය කරුණු සිරස්ව හා තිරස්ව සමෝධානිකව පෝෂණය කර ගැනීමට හැකි වීම වාසි සහගත වී ඇත. විශේෂයෙන් දැනුම පදනම් කරගත් ප්‍රශ්නවල පහසුතාව ඉහළ අගයක් ගෙන ඇත. ශ්‍රී ලංකාවේ පිහිටීම, ප්‍රාග් ඓතිහාසික, පූර්ව ඓතිහාසික, ඓතිහාසික ස්ථාන සහ ඒ පිළිබඳ තොරතුරු ද (සෙල්ලිපි, සුසාන, උරුමයන්, පැරණි තාක්ෂණය හා මිනුම් ක්‍රම) ජාතික ව්‍යාපාර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, අධිරාජ්‍යවාදී පාලනය යන තේමා ඔස්සේ ද දැනුම පදනම් කර ගෙන ප්‍රශ්න සැකසී තිබීම ඉහළ පහසුතාව සඳහා හේතුවන්නට ඇත.

ලෝක ඉතිහාසය සම්බන්ධ ප්‍රශ්නවල සමස්ත පහසුතාව 67%කි. පුනරුදය, කාර්මික විප්ලවය, ලෝක සංග්‍රාම යන තේමා පදනම් කරගෙන ප්‍රශ්න සකස් වී ඇත. කණිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ඉතිහාසය විෂයය යටතේ ඉහත සඳහන් කර ඇති තේමා ඔස්සේ ලද දැනුම I පත්‍රයේ ලෝක ඉතිහාසය කොටස සඳහා ඉහළ පහසුතාව ලැබීමට ඉවහල් වී ඇති බව පෙනී යයි.

PAST PAPERS WIKI

2.1.5 **I** පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | ප්‍රතිචාර නොදැක්වූ |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | |
| 1 | 02 | 11.6% | **79.6%** | 5.1% | 3.5% | - |
| 2 | 01 | **80.6%** | 11.4% | 2.7% | 5.2% | - |
| 3 | 03 | 3.9% | 10.9% | **77.4%** | 7.7% | - |
| 4 | 04 | 14.6% | 12.5% | 9.7% | **63.0%** | - |
| 5 | 04 | 5.8% | 6.5% | 2.1% | **85.1%** | - |
| 6 | 02 | 19.6% | **61.0%** | 2.4% | 16.7% | - |
| 7 | 01 | **55.9%** | 17.4% | 14.6% | 11.7% | - |
| 8 | 03 | 3.6% | 3.5% | **91.0%** | 1.8% | - |
| 9 | 02 | 9.9% | **71.7%** | 12.7% | 5.4% | - |
| 10 | 03 | 17.6% | 15.2% | **28.1%** | 38.7% | - |
| 11 | 01 | **63.2%** | 20.4% | 9.2% | 7.0% | - |
| 12 | 03 | 23.6% | 10.0% | **46.4%** | 19.5% | - |
| 13 | 02 | 5.4% | **77.1%** | 7.0% | 10.3% | - |
| 14 | 04 | 10.3% | 7.6% | 6.6% | **75.2%** | - |
| 15 | 01 | **74.50%** | 6.8% | 12.8% | 5.7% | - |
| 16 | 04 | 7.1% | 10.8% | 9.3% | **72.6%** | - |
| 17 | 02 | 5.9% | **86.7%** | 3.1% | 4.3% | - |
| 18 | 01 | **46.2%** | 19.6% | 16.0% | 17.9% | - |
| 19 | 03 | 22.9% | 17.4% | **46.1%** | 13.2% | - |
| 20 | 02 | 19.6% | **38.9%** | 23.7% | 17.5% | - |
| 21 | 04 | 14.4% | 20.0% | 20.4% | **45.0%** | - |
| 22 | 02 | 27.9% | **59.5%** | 5.1% | 7.2% | - |
| 23 | 03 | 11.5% | 21.6% | **52.3%** | 14.3% | - |
| 24 | 03 | 9.6% | 19.0% | **59.4%** | 11.7% | - |
| 25 | 04 | 3.0% | 10.9% | 12.8% | **72.9%** | - |
| 26 | 03 | 62.3% | 14.9% | **10.8%** | 11.6% | - |
| 27 | 02 | 27.6% | **49.3%** | 13.6% | 9.2% | - |
| 28 | 04 | 17.9% | 13.0% | 16.0% | **52.7%** | - |
| 29 | 03 | 2.8% | 16.0% | **69.4%** | 11.5% | - |
| 30 | 01 | **50.7%** | 28.8% | 10.7% | 9.5% | - |
| 31 | 03 | 20.2% | 31.4% | **37.1%** | 10.9% | - |
| 32 | 01 | **82.7%** | 5.0% | 10.4% | 1.8% | - |
| 33 | 02 | 2.0% | **92.3%** | 4.6% | 1.1% | - |
| 34 | 02 | 5.5% | **81.1%** | 8.1% | 5.2% | - |
| 35 | 03 | 20.1% | 9.4% | **56.3%** | 13.9% | - |
| 36 | 01 | **79.1%** | 7.3% | 6.2% | 7.2% | - |
| 37 | 02 | 4.6% | **59.6%** | 20.2% | 15.4% | - |
| 38 | 04 | 6.8% | 11.6% | 30.8% | **50.6%** | - |
| 39 | 03 | 12.2% | 24.0% | **57.1%** | 6.2% | 1% |
| 40 | 02 | 12.4% | **60.4%** | 18.3% | 8.5% | - |

**වගුව 06**

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

PAST PAPERS WIKI

### 2.1.6. I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

2016 වර්ෂයේ I වැනි පත්‍රය සැකසීමේ දී ශ්‍රී ලංකා ඉතිහාසය කොටසට ප්‍රශ්න 32ක් (80%) ද, ලෝක ඉතිහාසය කොටසට ප්‍රශ්න 08ක් (20%) ද ඇතුළත් කර ඇත.

I ප්‍රශ්න පත්‍රයේ පහසුතාව 60% ඉක්ම වූ ප්‍රශ්න 20කි. ඒවා අතරින් ශ්‍රී ලංකා ඉතිහාස කොටසින් ප්‍රශ්න අංක 1, 2, 3, 4, 5, 6, 8, 9, 11, 13, 14, 15, 16, 17, 25, 29 සහ 32 ඇතුළත් වන අතර, ලෝක ඉතිහාස කොටසින් ප්‍රශ්න 03කි. එම ප්‍රශ්න අංක වන්නේ 33, 34 සහ 36 යි.

මෙම ප්‍රශ්න පත්‍රයේ පහසුතාව 80%ක් ඉක්ම වූ ප්‍රශ්න අංක වන්නේ 2, 5, 8, 17, 32, 33 සහ 34 ප්‍රශ්න යි. ඒවායේ පහසුතාව පිළිවෙළින් 80.67%, 85.13%, 91.00%, 82.70%, 86.70%, 92.27% හා 81.13% බැගින් වේ. මෙම ප්‍රශ්න සියල්ල ම දැනුම පදනම් කරගෙන ඇගයීමට ලක් කිරීම ඉහළ පහසුතාව කෙරෙහි බලපා ඇත.

I පත්‍රයේ සමස්තයක් ලෙස පහසුතාව 30%ට අඩු මට්ටමක ඇත්තේ ශ්‍රී ලංකා ඉතිහාසය කොටසේ ය. ප්‍රශ්න අංක 10 හා 26 යි. එම ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 28.13%ක් හා 10.80%කි. මෙම ප්‍රශ්න හොඳම පිළිතුර තේරීම් වර්ගයේ ප්‍රශ්න වේ. ඒවායේ ඇතුළත් වරණ තර්කානුකූල බුද්ධියකින් තෝරාගත යුතු වීම අපේක්ෂකයන්ගේ පහසුතාව අඩු වීමට හේතුවන්ට ඇත.

I පත්‍රයේ ලෝක ඉතිහාසය කොටසේ ප්‍රශ්න සියල්ල ම පහසුතාව 50% ඉක්මවා ඇත. ප්‍රශ්න අංක 33 පහසුතාව වැඩිම අගයක් පෙන්වන අතර එහි ප්‍රතිශතය 92.27%කි. පහළ ශ්‍රේණිවල දී මෙන් ම සමාන්තර විෂයයන් තුළින් ලත් දැනුම එවැනි ඉහළ පහසුතාව ලැබීමට හේතුවන්නට ඇත.

පළමු පත්‍රය පිළිබඳ ව ඉහළ සාධන මට්ටමක් ලබා දීම සඳහා පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව විෂයයට සම්බන්ධ පුද්ගලයන්ගේ පින්තූර හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ පින්තූර ඇතුළත් ක්ෂේත්‍ර පොත් සැකසීමට සිසුන් යොමු කිරීම, භූමිකා රංගන, රූපවාහිනී වැඩසටහන් (knowlegde TV) අන්තර්ජාල පහසුකම් තුළින් විෂයානුබද්ධ දැනුම වැඩිකර ගැනීමට සිසුන් යොමු කිරීම ආදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යෝජනා කළ හැකි ය.

ශ්‍රී ලංකාව පිළිබඳවත් යුරෝපා, ආසියා හා ඇමරිකානු රටවල් පිළිබඳවත් සිසුන් තුළ ඇති දැනුම වර්ධනය කිරීම සඳහා ඉහත වැඩ සටහන් යොදා ගැනීම, සුදුසු බව යෝජනා කළ හැකි ය.

සම්මන්ත්‍රණ පැවැත්වීම, පෙරහුරු ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවීම, විෂය කරුණු මතක තබා ගැනීමේ ක්‍රමවේදවලට සිසුන් යොමු කිරීම, ප්‍රශ්න නිවැරදි ව තේරුම් ගැනීමට සිසුන් හුරු කිරීම ආදි ක්‍රියාකාරකම් මගින් ඉහළ සාධන මට්ටමක් කරා සිසුන් මෙහෙය විය හැකි ය.

PAST PAPERS WIKI

### 2.2 II පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.2.1 II පත්‍රයේ ව්‍යුහය

I **පත්‍රය** - කාලය පැය 01යි. මුළු ලකුණු 80යි.

බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. 10 **ශ්‍රේණිය සඳහා 50% ක්ද**, 11 **ශ්‍රේණිය සඳහා 50% ක් ද**, වශයෙන් බර තැබෙන ආකාරයට ප්‍රශ්න සකස් කරන අතර ඒ තුළ **80%ක් ශ්‍රී ලංකා ඉතිහාසය** සම්බන්ධ නිපුණතා සඳහා ද, **20% ක් ලෝක ඉතිහාසය** හා සම්බන්ධ නිපුණතා සඳහා බර තැබේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 80යි.

II **පත්‍රය** - කාලය පැය 03යි. මුළු ලකුණු 120යි.

මෙය I, II හා III වශයෙන් ප්‍රධාන කොටස් 3කින් යුක්ත ය.

I **කොටස**

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එහි (a) හා (b) වශයෙන් කොටස් දෙකකි.

(a) කොටස - සිතියම් ලකුණු කිරීම - ලකුණු 18යි.

(b) කොටස - පින්තූර ආශ්‍රිත / ඓතිහාසික සිද්ධි ආශ්‍රිත කොටස් තුනකින් සමන්විත ය. ලකුණු 12යි. ලකුණු $4 \times 3 = 12$

II **කොටස**

ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 6කින් සමන්විත ය. ඉන් 4කට පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න 6 නිපුණතා මට්ටම්වලට වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාවට අනුකූල ව පහත පාඩම් ඒකකවලින් සකස් කෙරේ.

**10 ශ්‍රේණිය - 1, 2, 3, 4, 5, 6, 7, 8, 10**

**11 ශ්‍රේණිය - 2, 3, 4, 5, 6** ලකුණු $18 \times 4 = 72$

III **කොටස**

ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 2කින් සමන්විත ය. ඉන් එකකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න දෙක නිපුණතා මට්ටම්වලට වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාවට අනුකූල ව පහත පාඩම් ඒකකවලින් සකස් කෙරේ.

**10 ශ්‍රේණිය - 9**

**11 ශ්‍රේණිය - 1, 7, 8** ලකුණු $18 \times 1 = 18$

**අවසාන ලකුණ ගණනය කිරීම :**

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 80 |
| II පත්‍රය | = | 120 |
| අවසාන ලකුණ | = | 200 ÷ 2 = 100 |

PAST PAPERS WIKI

### 2.2.2 II පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

| |
|---|
| II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1, 4.2, හා 4.3 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත. |

## I කොටස

1 ප්‍රශ්නය

**1.** **(අ)** පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) දැදුරු ඔය, ගල් ඔය, ලංකාපටුන, හලාවත, කතරගම, සෙංකඩගල, බූන්දල, ඉබ්බන්කටුව, යෝධ වැව, නල්ලූර්, කලා වැව, ඌරාතොට (ලකුණු 12 යි)

(ii) මදුරාසිය (චෙන්නායි), පර්සියන් බොක්ක, ජාවා දූපත, ඉතාලිය, කැලිකට්, කොන්ස්තන්තිනෝපලය (ලකුණු 06 යි)

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ඉන්දියාවට ගොඩ බැස තමන් ක්‍රිස්තියානින් සහ කුළුබඩු සොයා පැමිණි බව ප්‍රකාශ කළ තැනැත්තා


*B* - 'තිලෝක සුන්දරී' නමැති කාලිංග කුමරිය විවාහ කර ගත් පොළොන්නරු පාලකයා

*C* - මෙරට පාලනය කළ පළමු ලම්බකර්ණ රජතුමා

*D* - දෙවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ ඉතාලි පැසිස්ට් පාලකයා (ලකුණු 04 යි)

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. '*A*' වලින් දැක්වෙන නිර්මාණය හඳුන්වන නම කුමක් ද?
2. මෙය සොයා ගන්නා ලද්දේ කවර ස්තූපයක කරන ලද කැණීමකින් ද?
3. මෙම නිර්මාණය නිර්මිත ලෝහය කුමක් ද?
4. මෙම පුරාවස්තුව සොයා ගත් ස්ථානයේ දී උපත ලැබුවේ යැයි සැලකෙන රජතුමාගේ නම කුමක් ද?
(ලකුණු 04 යි)



*A*

(iii) 1. '*B*' වලින් දැක්වෙන නිර්මාණයේ නම කුමක් ද?
2. මෙය කිනම් ආගමකට අයත් ද?
3. මෙය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කවර ඓතිහාසික නගරයක ද?
4. මෙය ගොඩනඟන ලද්දේ ශ්‍රී ලංකාව යටත් කර ගත් කවර විදේශීය පාලකයන් විසින් ද?
(ලකුණු 04 යි)




*B*

PAST PAPERS WIKI

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය


1 ප්‍රශ්නය

(1) (අ) (i)




(ලකුණු 10යි)

**(1) (ආ) (ii)**




(ලකුණු 08යි)


PAST PAPERS WIKI

(ආ) (i) A - වස්කෝද ගාමා
B - පළමුවන විජයබාහු රජු/ මහා විජයබාහු
C - වසභ රජු
D - බෙනිටෝ මුසෝලිනී/ මුසෝලිනී (ලකුණු 01 × 04 = 04යි)

(ii) 1. - ඇත් පහන
2. - සූතිඝර චෛත්‍යය/දැදිගම කොටවෙහෙර
3. - ලෝකඩ
4. - පළමුවන පරාක්‍රමබාහු/මහා පරාක්‍රමබාහු (ලකුණු 01 × 04 = 04යි)

(iii) 1. - ශිව දේවාලය
2. - ශිව/ශෛව/හින්දු
3. - පොළොන්නරුව/පුලතිසිපුර/ පුලස්තිපුර
4. - සොළී/චෝල (ලකුණු 01 × 04 = 04යි)


**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එසේ වුව ද ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 99%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු 16 - 22 ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 23 - 30 ප්‍රාන්තරයේ 10%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 30න් ලකුණු 23 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 10%ක් වන අතර 26%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයට අනුකොටස් 14ක් ඇති අතර, ඉන් 80%කට වැඩි පහසුතාව දක්වා ඇත්තේ කොටස් 04කට පමණි. මෙම ප්‍රශ්නයේ වැඩි ම පහසුතාවයක් පෙන්වා ඇත්තේ (ආ) කොටසේ (iii) (2) වන අතර, එහි පහසුතාව 89%ක් වේ. අඩු ම පහසුතාව දක්වා ඇත්තේ (අ) (i) කොටසට ය. එහි පහසුතාව 28%කි.

PAST PAPERS WIKI

පළමු ප්‍රශ්නයේ (අ) කොටසේ (i) හා (ii) පිළිවෙළින් ශ්‍රී ලංකා සිතියම හා ලෝක සිතියම් කොටස ලකුණු කිරීම වේ. එහි පහසුතාව පිළිවෙළින් 28%ක් හා 36%ක් වේ. ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන ලකුණු කර නම් කිරීමට වඩා ලෝක සිතියමේ ස්ථාන ලකුණු කර නම් කිරීම පහසුතාව වැඩි වී ඇත.

පළමු ප්‍රශ්නයේ (ආ) (i) කොටසේ A, B, C හා D පිළිවෙළින් ඓතිහාසික පුද්ගලයන් පිළිබඳව යි. පහසුතාව පිළිවෙළින් 49%ක්, 41%ක්, 60%ක් සහ 53%ක් යන මට්ටම්වල පවතී. අඩු ම පහසුතාව දක්වා ඇත්තේ B කොටසට ය. එහි දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ දේශපාලන තොරතුරු හා පුද්ගල නාම සම්බන්ධව යි. එම කොටසේ C අනුකොටස වැඩි ම පහසුතාව පෙන්වා ඇත.

(ආ) කොටසේ (ii) හා (iii) කොටස්වලට A හා B පින්තූර ආශ්‍රයෙන් පිළිතුරු සැපයිය යුතු වේ. එහි A පින්තූරය ඇසුරෙන් (ii) කොටසේ 1 ප්‍රශ්නය සඳහා පහසුතාව 88%කි. පෙළපොතේ ඇතුළත් පින්තූරයේ නම විමසීම පහසුතාව ඉහළ මට්ටමක පැවතීමට හේතු වී ඇත. සෙසු කොටස් සඳහා පහසුතාව පිළිවෙළින් 50%, 56%, 40% බැගින් වී ඇත්තේ පින්තූර ආශ්‍රිත අමතර දැනුම ප්‍රමාණවත් නොවීම යි.

(ආ) කොටසේ (iii) B පින්තූරය ද නම නිවැරදි ව නම් කිරීම ඒ ආශ්‍රිත ආගම පිළිබඳ දැනුම, පිහිටි නගරය නම් කර පිළිවෙළින් 87%, 89% හා 81% පහසුතාව ලබා ඇත. (4) කොටසට පහසුතාව 30% තරම් පහළ මට්ටමක ඇත්තේ නිර්මාණ කළ ජාතීන් හා පින්තූරය සමග බැඳීමකින් අධ්‍යයනය කර නොමැති වීම නිසා විය හැකි ය.

සමස්තයක් ලෙස ගත් කළ පළමු ප්‍රශ්නයේ දැනුම වර්ධනය කිරීම සඳහා අඛණ්ඩව සිතියම් ලකුණු කිරීම, සිතියම් ප්‍රදර්ශනය කිරීම, පින්තූර ඇතුළත් බිත්ති පුවත්පත් සැකසීම, පරිගණක ආශ්‍රිත ඉදිරිපත් කිරීම්, ක්‍රියාකාරකම්, අධ්‍යාපන චාරිකා ආදිය සිදු කිරීම යෝග්‍ය වේ. සිතියම් ලකුණු කර නම් කිරීමේ දී පැරණි නාම හා වර්තමාන නාම පිළිබඳ දැනුම වර්ධනය කිරීම ද වඩා වැදගත් වේ.

PAST PAPERS WIKI

## II කොටස

**2 ප්‍රශ්නය**

**නිපුණතාව :** **ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප, ඔවුන්ගේ වාසස්ථාන හා පරිසරය කළමනාකරණය කළ ආකාරය ද, පූර්ව ඓතිහාසික යුගයේ අභිචාර විධි පිළිබඳව ද දැනුම හා අවබෝධය පිරික්සීම.**

**2.** (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත්වූ පරිසර කලාප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූයේ යැයි සැලකෙන වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන පැවති ස්ථාන **දෙකක්** සහ ගල් ගුහා වාසස්ථාන පැවති ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ආහාර රටාව ඔවුන් ජීවත් වූ විවිධ පරිසරයන්ට අනුව හැඩ ගැසී තිබූ ආකාරය නිදසුන් **දෙකක්** දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත්වූවකු මිය ගිය විට අනුගමනය කරන්නට ඇතැයි සැලකෙන අවමංගල්‍ය චාරිත්‍ර විධි මොනවා දැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2. (i)**
- ⋆ පහත රට තෙත් කලාපය
- ⋆ පහත රට වියළි කලාපය
- ⋆ අර්ධ ශුෂ්ක කලාපය
- ⋆ කඳුකර තෙත් කලාපය
- ⋆ කඳුකර වියළි කලාපය
- ⋆ පහත රට ශුෂ්ක කලාපය
- ⋆ පහත රට අතරමැදි කලාපය
- ⋆ පහත රට අතරමැදි වියළි කලාපය **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)**
- ● වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන
  - මිනිහාගල්කන්ද
  - පතිරාජවෙල
  - බුන්දල
- ● ගල්ගුහා වාසස්ථාන
  - පාහියන්ගල
  - බටදොඹලෙන
  - කිතුල්ගල බෙලිලෙන
  - පොතාන
  - අලිගල
  - අත්තනගොඩ අලුලෙන
  - රාවණා ඇල්ල **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)**
- ● පහත රට වියළි කලාපය - සතුන් දඩයම් කර ආහාරයට ගැනීම
- ● පහත රට තෙත් කලාපය - කලෑ දෙල්, අල වර්ග, කැලෑ කෙසෙල්, ගස් ගොලුබෙල්ලන්
- ● වෙරළ බඩ - ලුණු ආහාරයට එකතු කර ගැනීම, කලපු බෙල්ලන් ආහාරයට ගැනීම
- ● ගංගා ඇළ දොළ - මිරිදිය මසුන් **(ලකුණු 02 + 03 = 05යි)**


PAST PAPERS WIKI

**(iv)**
- මහා ශිලා සමුප්‍රදායට අයත් සුසාන ක්‍රම දක්නට ලැබීම. (විශාල ගල්පතුරු එක්තැන් කොට චතුරස්‍රාකාර හැඩයකට සකසා ඇති සොහොන්)
- මිනිස් භෂ්මාවශේෂ සහිත වළං එම සුසාන ගර්භ තුළ තැන්පත් කිරීම - ශිලා මංජුසා සොහොන් නමින් ද හැඳින්වේ.

  උදා :- ඉබ්බන්කටුව මහා ශිලා සුසානය
  යාපහුවේ ගල් සොහොන් කනත්ත
  යටිගල්පොත්තේ සුසාන භූමිය
- සාමාන්‍ය මැටි බඳුනක භෂ්මාවශේෂ තැන්පත් කොට පොළොවේ වැළලීම - කුම්භියනිබනන නමින් හැඳින්වේ
- මැටි ඔරු සුසාන - අමු මැටියෙන් සකසන ලද ඔරුවක මිනිස් ඇට සැකිලි ආදාහනය කර පසුව භෂ්මාවශේෂ බහාලූ මැටි වළං එහි තැන්පත් කිරීම

  උදා :- හල්දුම්මුල්ල, බෙරගල, රංචාමඩම සුසානය **(ලකුණු 02 + 04 = 06යි)**


**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




02 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 93%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 18%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 18න් ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 18%ක් වන අතර, 26%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




- ⋆ මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 4 අතුරෙන් පහසුතාව වැඩි ම අනු කොටස *(i)* වන අතර එහි පහසුතාව 57%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(iv)* වන අතර එහි පහසුතාව 40%කි.

PAST PAPERS WIKI

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප, ඔවුන්ගේ වාසස්ථාන හා පරිසරය කළමනාකරණය කළ ආකාරය ද, පූර්ව ඓතිහාසික යුගයේ අභිචාර විධි පිළිබඳ ව ද දැනුම හා අවබෝධය පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර, එම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 93%කි. ප්‍රශ්න පත්‍රයේ ජනප්‍රිය ම ප්‍රශ්නය යි.

මෙම ප්‍රශ්නයේ *(i)* කොටස සඳහා පහසුතාව 57%කි. පෙළපොතේ මේ සඳහා පිළිතුරු නිශ්චිත ව දක්වා ඇති නිසා අයදුම්කරුවන් පෙළපොත හොඳින් පරිහරණය කළේ නම් ඉහළ පහසුතාව ලබා ගත හැකිව තිබුණි.

මෙම ප්‍රශ්නයේ *(ii)* හා *(iii)* කොටස් පිළිවෙළින් 56%ක් හා 54%ක් බැගින් පහසුතාව පෙන්නුම් කර ඇත. *(ii)* කොටස සඳහා පිළිතුරු ලබා දීමේ දී ප්‍රශ්නයේ කොටස් දෙක මාරු කරගෙන සිසුන් පිළිතුරු ලබා දී තිබුණි. වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන සහ ගල්ගුහා වාසස්ථාන පිහිටි තැන් නිවැරදි ව වෙන් කර හඳුනා ගැනීමට සිසුන් අපොහොසත් වී සිටි බව පෙනී යයි.

මෙම ප්‍රශ්නයේ *(iv)* වන කොටස සඳහා පහසුතාව 40%ට අඩු බව පෙන්වා ඇත. මෙම පාඩමට අදාළ යුග තුන සැසඳීමට හැකිවන සේ එකම සටහනක ගොනු කර සිසුන්ට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් නිවැරදි ව දැනුම ලබා දිය හැකි බව යෝජනා කළ හැකි ය.

**3 ප්‍රශ්නය**

**නිපුණතාව : ශිලා ලිපි මූලාශ්‍රවල සඳහන් තොරතුරු අනුව විවිධ සමාජ ස්ථරවලට පුද්ගලයින්ගේ තනතුරු නාම හඳුනා ගැනීම, රජතුමාගේ සේවාවන් පිළිබඳ අවබෝධය හා වසභ රජතුමාගේ කාර්යභාරය ඇගයීමේ හැකියාව පිරික්සීම**

**3.** (i) මෙරට ශිලා ලිපිවල සඳහන් තොරතුරුවලට අනුව පහත *A*, *B* හා *C* වලින් දැක්වෙන එක් එක් පුද්ගලයන්ගේ තනතුරු නාම අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - පවුලක ප්‍රධානියා
*B* - ගමක ප්‍රධානියා
*C* - ගම් කිහිපයක හෝ වැව් පද්ධතියක ප්‍රධානියා (ලකුණු 03 යි)

(ii) මධ්‍යම පාලනයට සම්බන්ධ පහත සඳහන් කාර්ය භාර වූ තැනැත්තන්ගේ නිල නාම මොනවා දැයි වරහන් තුළින් තෝරා *A*, *B*, *C* හා *D* අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - ඇමති මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම
*B* - රාජ්‍ය භාණ්ඩාගාරය සම්බන්ධව කටයුතු කිරීම
*C* - නගරයේ පාලනය සම්බන්ධව කටයුතු කිරීම
*D* - රජුගේ ඇතුන් සම්බන්ධව කටයුතු කිරීම

(වෙදනා, මහමත, බඩගරික, ශෙනපති, හති අදෙක, නගරගුතික, අස අදෙක, බතගු) (ලකුණු 04 යි)

(iii) රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කළ සේවා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) වසභ රජතුමා මෙරට බිහි වූ ශ්‍රේෂ්ඨ පාලකයකු බව කරුණු **තුනක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

**3. (i)** *A* - ගෘහපති/ ගහපත
*B* - ගමික/ ග්‍රාමික/ ග්‍රාමභෝජක
*C* - පරුමක (ලකුණු 01 × 03 = 03යි)


PAST PAPERS WIKI

**(ii)** *A* - මහමත *B* - බඩගරික
*C* - නගරගුතික *D* - හති අදෙක (ලකුණු 01 × 04 = 04යි)

**(iii)** ★ රටේ සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම
★ රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම
★ ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනය
★ ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** - නව රාජ පෙළපතක් ආරම්භ කිරීම
- ඒකීය ලංකාවක් ඇති කිරීම
- වාරි තාක්ෂණික කටයුතු
  - මහවැව් ඉදිකිරීම් ඇරඹීම
  - උමං ජල මාර්ග
- බදු අය කිරීම ක්‍රමවත් කිරීම
- ආගමික දියුණුවට කටයුතු කිරීම
  - වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය
  - නඩත්තුව හා අලුතින් තැනවීම **(ලකුණු 03 + 03 = 06යි)**


**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




03 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 93%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 31%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 26%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 18න් ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 26%ක් වන අතර, 14%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 9 අතුරෙන් පහසුතාව වැඩි ම අනු කොටස *(ii) C* වන අතර එහි පහසුතාව 94%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(iv)* වන අතර එහි පහසුතාව 46%කි.

ශිලා ලිපි මූලාශ්‍රවල සඳහන් තොරතුරු අනුව විවිධ සමාජ ස්ථරවල පුද්ගලයින්ගේ තනතුරු නාම හඳුනා ගැනීම, රජතුමාගේ සේවාවන් පිළිබඳ අවබෝධය හා වසභ රජතුමාගේ කාර්යභාරය ඇගයීමේ හැකියාව පිරික්සීමට මෙම ප්‍රශ්නය සකස් වී ඇති අතර, මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 93%කි. මෙම ප්‍රශ්නය ද ජනප්‍රිය ප්‍රශ්නය කි.

මෙම ප්‍රශ්නයේ *(i)* කොටසේ *A, B* සහ *C* අනු කොටස් තුන සඳහා ම 75% හෝ ඊට වැඩි පහසුතාව ලබා ඇත. මේ අතුරෙන් *B* අනු කොටස සඳහා 88%ක ඉහළ ම පහසුතාව දක්වා ඇත. ද්විතීයික විෂය නිර්දේශවල මේ සම්බන්ධ තොරතුරු ඇතුළත් ව තිබෙන අතර ප්‍රශ්නයට අදාළ පිළිතුර සපයා ගැනීමට එය උදව්වකි.

මෙම ප්‍රශ්නයේ *(ii)* කොටසේ *A, B,C* සහ *D* යන කොටස් හතර ම සඳහා 73%ට හෝ ඊට වැඩි පහසුතාව ලබා ඇති අතර, පිළිවෙළින් 73%ක්, 81%ක්, 94%ක් හා 77%ක් ද ලබා ඇත. මෙවැනි ඉහළ පහසුතාව ලබා ගැනීමට හේතු වී ඇත්තේ ප්‍රශ්නයට අදාළ පිළිතුරු වරහන් තුළ දක්වා තිබීම නිසා ය. අපේක්ෂකයාට කළ යුතුව ඇත්තේ වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා ලිවීම ය.

මෙම වර්ගයේ ප්‍රශ්න ලබා දීම තුළින් දීර්ඝ විෂය නිර්දේශයක් මතක තබා ගැනීමට සිදුවීමේ දී වන අපහසුව බොහෝ දුරට මග හරවා ගත හැකි වීමටත්, ඉහළ පහසුතාව ලබා ගැනීමට හේතු විය හැකි ය.

මෙම ප්‍රශ්නයේ *(iii)* කොටසේ පහසුතාව 55%කි. පෙළ පොතේ ඇති තොරතුරු සමෝධානිකව අධ්‍යයනය කර විෂය කරුණු ගොනු කර ඉදිරිපත් කිරීමේ හැකියාව ලබා ගත්තේ නම් මීට වඩා සාර්ථක පිළිතුරක් අපේක්ෂා කළ හැකිව තිබුණි.

මෙම ප්‍රශ්නයේ *(iv)* වන කොටසේ පහසුතාව 46%කි. මෙම ප්‍රශ්නයේ කොටස් හතර අතරින් අඩු ම පහසුතාව පෙන්වා ඇති කොටස යි. වසභ රජු සම්බන්ධ ව පෙළපොතේ තොරතුරු විවිධ ක්ෂේත්‍ර යටතේ ඉදිරිපත් කළ නොහැකි වීම මෙම අවම සාධන මට්ටමට හේතු වී ඇත. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා පෙළපොතේ තොරතුරු විවිධ ක්ෂේත්‍ර යටතේ ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කිරීම කළ හැකිය. *(iii)* හා *(iv)* කොටස් සඳහා විෂය කරුණු විශ්ලේෂණය හා සංස්ලේෂණය කිරීමට සිසුන් යොමු කිරීම වඩා සුදුසු ය.

PAST PAPERS WIKI

4 ප්‍රශ්නය

නිපුණතාව : අතීත වාරි කළමනාකරණය එහි තාක්ෂණික ගුණාංග හා වාරි කළමනාකරණයේ පරිහානිය පිළිබඳ තුලනාත්මක අවබෝධය පිරික්සීම.

**4.** (i) ඇළහැර ඇළ මගින් ජලය සපයනු ලබන වැව් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - මහියංගනයට දකුණු දෙසින් මහවැලි ගඟ හරස්කොට තැනූ අමුණ

*B* - කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙනයාම සඳහා නිර්මාණය කළ ඇළ

*C* - "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු ය." යන අදහස දැරූ රජතුමා

*D* - වර්ෂා ජලයෙන් පෝෂණය වන කුඩා වැව් පද්ධතියක් හඳුන්වනු ලබන නම (ලකුණු 04 යි)

(iii) (a) වැවක ප්‍රධාන තාක්ෂණික අංග **දෙකක්** නම් කරන්න.

(b) ඔබ ඉහත (a) හි නම් කළ, එක් තාක්ෂණික අංගයක නිර්මාණය හා ප්‍රයෝජන පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසුව මහා පරිමාණ වාරිමාර්ග ක්‍රම බිහි නොවූයේ ඇයි දැයි කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4. (i)** - මින්නේරි වැව

- කවුඩුලු වැව
- ගිරිතලේ වැව
- කන්තලේ වැව

**(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - මිනිපේ/ මණිමේඛලා

*B* - යෝධ ඇළ/ ජය ගඟ

*C* - මහා පරාක්‍රමබාහු/ පළමුවන පරාක්‍රමබාහු

*D* - වැව් ප්‍රපතනය/ එල්ලංගාව

**(ලකුණු 01 × 04 = 04යි)**

**(iii) (a)** - වැව් බැම්ම, බිසෝකොටුව, රළපනාව, පිටවාන, සොරොව්ව, ගොඩ-මඩ

**(b)** - සඳහන් කළ තාක්ෂණික අංගයේ නිර්මාණය හා ප්‍රයෝජන දක්වා තිබිය යුතුය


**(ලකුණු 02 + 01 + 01 + 01 = 05යි)**

**(iv)**
- ★ තෙත් කලාපය සදහා ජල සම්පාදන කටයුතු එතරම් අවශ්‍ය නොවීම
- ★ ජල සම්පාදනයට යෝග්‍ය භෞතික සාධක නොමැති වීම
- ★ කුළුබඩු වෙළඳාමට ප්‍රමුඛත්වයක් ලැබීම
- ★ වී වගාවට අමතරව විවිධ ආහාර වර්ග තිබීම (දෙල්, කොස්)
- ★ විශාල වාරිමාර්ග තැනීමට තරම් ප්‍රබල රජවරුන් බිහි නොවීම
- ★ පාලකයන් විසින් ආරක්ෂාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම
- ★ වැව් තාක්ෂණය අභාවයට යාම (අහස්දියෙන් වගා කිරීම)

**(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI


**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




04 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 59%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 45%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 12%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 6%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 18න් ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 6%ක් වන අතර, 37%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




- ⋆ මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 8 අතුරෙන් පහසුතාව වැඩි ම අනු කොටස *(iii) A* වන අතර එහි පහසුතාව 90%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(iv)* වන අතර එහි පහසුතාව 23%කි.

PAST PAPERS WIKI

අතීත වාරි කළමනාකරණය එහි තාක්ෂණික ගුණාංග හා වාරි කළමනාකරණයේ පරිහානිය පිළිබඳ තුලනාත්මක අවබෝධය පිරික්සීම සඳහා මෙම ප්‍රශ්නය සකසා ඇත. මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂක සංඛ්‍යාව 59%කි.

මෙම ප්‍රශ්නයේ අඩු ම පහසුතාව වී ඇත්තේ *(iv)* කොටස වන අතර, එහි පහසුතාව 23%කි. වැඩි ම පහසුතාව වී ඇත්තේ *(ii)* කොටසේ *A* අනු කොටසයි. එහි පහසුතාව 90%කි.

මෙම ප්‍රශ්නයේ *(i)* කොටස සඳහා පහසුතාව 24%කි. එවැනි අඩු සාධන මට්ටමක් ලබා ගැනීමට හේතු වී ඇත්තේ ජල කළමනාකරණය පිළිබඳ ව අපේක්ෂකයාට මනා අවබෝධයක් නොතිබීම යි. එය මග හරවා ගැනීමට ඇළ මාර්ග හා වැව් තැනූ රජවරු පිළිබඳ වගු ඇසුරින් කරුණු ඉදිරිපත් කළ හැකි අතර, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිතියම් භාවිතා කිරීම කළ යුතු බව යෝජනා කෙරේ.

මෙම ප්‍රශ්නයේ *(ii)* කොටසේ *A, B, C* සහ *D* වශයෙන් අනුකොටස් හතරකි. පිළිවෙළින් එහි පහසුතාව 46%ක්, 45%ක්, 56%ත් හා 41%ක් බැගින් වේ. පහසුතාව මෙවැනි පහළ අගයක් ගැනීමට හේතු වී ඇත්තේ මෙම ප්‍රශ්න පිළිබඳ ව නිශ්චිත පිළිතුරු අපේක්ෂකයන් බහුතර සංඛ්‍යාවක් නොදැන සිටීම යි. මෙම තත්ත්වය මග හරවා ගැනීමට රජවරුන් සම්බන්ධ තොරතුරු, පන්ති කාමරයේ නිතර දැකීමට හැකි වන අයුරින් ප්‍රදර්ශනය කළ හැකි ය.

එමෙන් ම මෙම තොරතුරු වගු ගත {ාට ප්‍රදර්ශනය කිරීම ද ප්‍රයෝජනවත් වන බව පෙනී යයි. එම වගු සටහන පහත ආකාරයට ද සකස් කළ හැක.

| රජතුමාගේ නම | ඉදිකළ වැව | සම්බන්ධ ගංගාව | ඇළ මාර්ගය/ අමුණ |
|---|---|---|---|
| | | | |

*(iii) A* කොටස ඉතා ම සුවිශේෂතාවයක් ලබා තිබේ. පහසුතාව 90% දක්වා ඉහළ යාමට හේතු වී ඇත්තේ වැවක අංග සිසුන්ගේ මතකයේ රැඳී තිබීමයි. පෙළපොතේ හා ආශ්‍රිත ග්‍රන්ථවල රූප සටහන් ඇසුරෙන් වැවෙහි අංග ලකුණු කර නම්කර තිබීම සිසු ස්මරණ ශක්තිය ප්‍රභලවන්නට හේතු වී ඇත.

එම ප්‍රශ්නයේ ම *B* කොටසේ පහසුතාව 46% දක්වා පහළ මට්ටමකට පත්ව ඇත. එයට හේතු වී ඇත්තේ *(a)* කොටසේ නම් කළ අංගයක නිර්මාණය හා ප්‍රයෝජන වෙන් වෙන් ව විස්තර කර ලිවීමට ඇති නොහැකියාව යි. පහසුතාවය තවත් වර්ධනය කර ගැනීමට පෙළ පොත පරිහරණය වැඩි කිරීම, අභ්‍යාසවල නිරත කිරීම වැවක ආකෘති කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් ගොඩනගා ප්‍රායෝගික ව පෙන්නුම් කර න්‍යායාත්මක කරුණු නැවත නැවත සාකච්ඡා කිරීම. පාඩම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවේ නිරත වන කාලය තුළ ම ක්ෂේත්‍ර චාරිකාවක් මගින් වැවක්, දැක බලා ගැනීම හා ඉන් පසු දැක ගත් කරුණුවලින් ක්‍රියාකාරකම්වල නිරත කිරීම, කරුණු වගුගත කිරීම ඉතාමත් උචිත වේ. මීට අමතර ව වැවක අංග හා ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරන වීඩියෝ පට වැනි පරිඝනක ආශ්‍රිත වැඩසටහන් ප්‍රදර්ශනය කිරීම මගින් ද මෙම අවබෝධය ශිෂ්‍යයාට ලබා දීම සුදුසු බව යෝජනා කෙරේ. මෙහි දී 8 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොත පරිහරණය කිරීම තුළින් තවදුරටත් දැනුම වර්ධනය කර ගැනීමට අවස්ථාව ලැබේ.

මෙම ප්‍රශ්නයේ *(iv)* කොටස අඩු ම පහසුතාව ලබා ඇති කොටසයි. එහි පහසුතාව 23%කි. ඊට හේතුව වී ඇත්තේ අපේක්ෂකයන් මෙම ප්‍රශ්නය නිවැරදි ව තේරුම් නොගැනීමත් මීට අදාළ පිළිතුරු පෙළපොතේ සුවිශේෂීව ගොනුගතව නොතිබීමත් විය හැකි ය. මෙම තත්ත්වය මග හරවා ගැනීමට නම් පෙළපොතට අමතර ව කණිෂ්ඨ ද්විතීයික පන්තිවල පෙළපොත්වල ඇති කරුණු ගැන සැලකිලිමත් වෙමින්, එම කරුණු පිළිබඳ ව අවධානය යොමු කොට ශිෂ්‍යයාට නිවැරදි ව එම කරුණු පැහැදිලි කර දීම සුදුසු බව යෝජනා කළ හැකි ය. තව ද පෙළපොතේ විවිධ පාඩම්වල ඇති ඓතිහාසික තොරතුරු සමෝධානිකව අධ්‍යයනය කිරීමේ වැදගත්කම ඉගෙනුම්-ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලියේ දී භාවිතා කිරීම ද වැදගත් වේ. ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න ලිවීම පිළිබඳ පෙරහුරු අභ්‍යාස කරවීම ද යෝග්‍ය වේ.

PAST PAPERS WIKI

5 ප්‍රශ්නය

**නිපුණතාව :** රජරට, මායා රට, මලය රට ආශ්‍රිත පාලන මධ්‍යස්ථාන පිළිබඳ දැනුම හා හයවන පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය ඇගයීමේ හැකියාව පිරික්සීම

**5.** (i) පහත *A*, *B* හා *C* යටතේ දක්වා ඇති කාර්ය හා සම්බන්ධ වන පාලකයන් කවුරුන් දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න.

*A* - අනුරාධපුරය සියලු නගරාංගවලින් යුත් පාලන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම

*B* - සීගිරිය තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම

*C* - රජරට චෝල ආධිපත්‍යයෙන් මුදා ගෙන, පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගැනීම (ලකුණු 03 යි)

(ii) *A* - ඓතිහාසික මායා රටට අයත් දෙවන නාගරීකරණ පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද

*B* - ඓතිහාසික මලය රටට අයත් දෙවන නාගරීකරණ පාලන මධ්‍යස්ථාන **දෙකක්** ද

සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවන නාගරීකරණ යුගයේ පාලන මධ්‍යස්ථාන තෝරා ගැනීම සම්බන්ධයෙන් බලපෑ මූලික කරුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) හයවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකීමට තුඩු දුන් සාධක **තුනක්** දක්වා, ඒවා සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**5. (i)** *A* - හත්වන බුවනෙකබාහු

*B* - පළමුවන කාශ්‍යප/ සීගිරි කාශ්‍යප

*C* - පළමුවන විජයබාහු රජ/ මහා විජයබාහු රජ **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, {ïටිටේ (මින් දෙකක්)


*B* - ගම්පොල, මහනුවර **(ලකුණු 02 + 02 = 04යි)**

**(iii)**
- ★ ආරක්ෂාව
- ★ අහස් දියෙන් වී වගා කළ හැකි ප්‍රදේශ වීම
- ★ වර්ධන වෙමින් පැවති විදේශ වෙළෙඳාම (කුළුබඩු)
- ★ වෙරළ බඩ නැව් තොටුපලවලට පහසුවෙන් ළඟා වීමේ හැකියාව **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)**
- ★ අවසන් වරට රට එක්සත් කළ පාලකයා වීම
- ★ වන්නි ප්‍රදේශ අවනත කර ගැනීම
- ★ යාපන ප්‍රදේශය නතු කර ගැනීම
- ★ ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මර්දනය
- ★ ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම
- ★ අධ්‍යාපනය දියුණු කිරීමට අනුග්‍රහ දැක්වීම
- ★ සාහිත්‍ය දියුණුවට කටයුතු කිරීම
- ★ ආගමික සහජීවන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම **(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




05 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 20%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 50%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 15%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 13%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 18න් ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 13%ක් වන අතර, 50%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




- ⋆ මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 7 අතුරෙන් පහසුතාව වැඩි ම අනු කොටස *(i) B* වන අතර එහි පහසුතාව 56%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(ii) B* වන අතර එහි පහසුතාව 30%කි.

රජරට, මායා රට, මලය රට ආශ්‍රිත පාලන මධ්‍යස්ථාන පිළිබඳ දැනුම හා හයවන පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය ඇගයීමේ හැකියාව පිරික්සීම සඳහා මෙම ප්‍රශ්නය සකස් කර තිබේ. ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 20%කි. ප්‍රශ්න පත්‍රයේ අඩු ම ජනප්‍රියතාවයක් ඇති ප්‍රශ්නය යි.

ප්‍රශ්නයේ *(i)* කොටස *A, B* හා *C* යටතේ අනු කොටස් තුනකට බෙදා ඇත. මෙම කොටස් සඳහා ලබා ඇති පහසුතාව පිළිවෙළින් 53%ක්, 56%ක්, 45%ක් බැගින් වේ. *C* අනු කොටස අඩු පහසුතාව ලබා තිබීමට හේතුව වී ඇත්තේ අපේක්ෂකයන් විෂය කරුණු නිවැරදි ව නොදැනීම යි. මීට පිළියමක් ලෙස කණිෂ්ඨ ද්විතීයික අවධියේ පෙළපොත්වල අදාළ කරුණු ද උපයෝගි කර ගනිමින්, පන්ති කාමරයේ දී මෙන් ම සම්මන්ත්‍රණ ආදියේ දී ද මෙම කරුණු පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කෙරේ.

මෙම ප්‍රශ්නයේ *(ii)* කොටස *A* හා *B* යනුවෙන් අනු කොටස් දෙකකට බෙදා ඇත. *A* කොටස සඳහා පහසුතාව 42%ක් වන අතර, *B* කොටස සඳහා පහසුතාව 30%කි. මෙවැනි අඩු පහසුතා අගයක් ලබා ගැනීමට හේතුව වී ඇත්තේ පාඩමට අදාළ ශ්‍රී ලංකාවේ පාලන මධ්‍යස්ථාන පිළිබඳ ව නිවැරදි ව වටහා ගෙන නොතිබීම යි. මෙහි දී මායා රට හා මළය රට පිළිබඳ ව අනවබෝධය පහසුතාව අඩු වීමට හේතු වී ඇති බව අනාවරණය වේ. පෙළපොතේ සපයා ඇති සිතියම් පවා අධ්‍යයනය කොට නොතිබීම මීට හේතුව විය හැකිය.

PAST PAPERS WIKI

මේ තත්ත්වය අවම කිරීමට නම් සිතියම් ලකුණු කිරීමේ දී වර්ණ භාවිත කරමින් මෙම කලාප පිළිබඳ ව සුවිශේෂ ව කරුණු පැහැදිලි කර දීම හා කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් සිතියම් ලකුණු කිරීමේ අභ්‍යාසවල සිසුන් යොමු කිරීම කළ හැකි ය.

5 වන ප්‍රශ්නයේ *(iii)* කොටස සඳහා ලබා ඇති පහසුතාව 31%කි. මෙවැනි අඩු පහසුතාව ලැබීමට හේතු වී ඇත්තේ නිවැරදි ව කියවා ප්‍රශ්නය අවබෝධ කරගෙන නොතිබීම යැයි නිගමනය කළ හැකි ය. එනිසා අපේක්ෂකයන් නිශ්චිත ව පිළිතුරු සැපයීමට අපොහොසත්ව ඇත. මෙම තත්ත්වය මගහරවා ගැනීමට නම් මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු ලියවීම හා පුනරීක්ෂණ කටයුතුවල ශිෂ්‍යයා යොමු කරවිය යුතු යි.

මෙම ප්‍රශ්නයේ *(iv)* වන කොටස සඳහා ලබා ඇති පහසුතාව 34%කි. පහසුතාව සංවර්ධනය සඳහා විවිධ රජවරු පිළිබඳ පෙළපොතේ විසිරී ඇති තොරතුරු ඒකරාශී කොට අධ්‍යයනය කිරීමේ වැදගත්කම අවබෝධ කර දීම වැදගත් වේ.

**6 ප්‍රශ්නය**

**නිපුණතාව : මහනුවර රාජධානියේ වැදගත් දේශපාලන සිදුවීම්, ආර්ථික තොරතුරු හා ඉඩම් බුක්තිය ඔස්සේ එහි අනන්‍යතාව පිළිබඳ දැනුම, අවබෝධය පිරික්සීම**

**6.** (i) *A* - මුල්වරට මහනුවර ස්වාධීන රාජධානියක් පිහිටු වූ රජතුමා
*B* - ක්‍රි.ව. 1580 දී උඩරට ආක්‍රමණය කළ සීතාවක පාලකයා
*C* - දෝන කතිරිනා නමින් බෞතීස්ම ලැබූ කරලියද්දේ බණ්ඩාරගේ දියණිය
කවුරුන් දැයි *A, B* හා *C* අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) *A* - රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් කළ ඉඩම්
*B* - බෞද්ධ විහාරවල නඩත්තුව සඳහා පූජා කළ ඉඩම්
*C* - රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ලබා දුන් ඉඩම්
*D* - දේවාලවල නඩත්තුව සඳහා වෙන් කළ ඉඩම්
කවර නම්වලින් හැඳින්වූයේ දැයි *A, B, C* හා *D* අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමා මහනුවර රාජධානියේ තම නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙකක්** සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පෘතුගීසි හා ලන්දේසි ජාතිකයන් විසින් මහනුවර රාජධානිය යටත් කර ගැනීමට කරන ලද ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**6. (i)** *A* - සේනා සම්මත වික්‍රමබාහු රජ
*B* - පළමුවන රාජසිංහ රජ/ සීතාවක රාජසිංහ රජ
*C* - කුසුමාසන දේවිය **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - ගබඩාගම්
*B* - විහාරගම්
*C* - නින්දගම්
*D* - දේවාලගම් **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)** ★ කුසුමාසන දේවිය විවාහ කර ගෙන රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම
★ රෝමානු කතෝලික ආගම අතහැර බුදුදහම වැළඳ ගැනීම
★ විමලධර්මසූරිය ලෙස බෞද්ධ නමක් ලබා ගැනීම
★ දළදා වහන්සේ මහනුවරට වැඩම කරවීම **(ලකුණු 02 + 03 = 05යි)**

PAST PAPERS WIKI

**(iv)** ★ උඩරට භෞතික පිසරය පිළිබඳ අවබෝධයක් නොතිබීම

★ උඩරැටියන්ගේ රාජපාක්ෂික බව

★ උඩරැටියන්ගේ ගරිල්ලා සටන් ක්‍රම / සැඟවී පහර දීම


★ උඩරට රජවරුන්ගේ රණ ශූරත්වය හා උපක්‍රමශීලී බව

★ ලස්කිරිඤ්ඤ හමුදාව තීරණාත්මක අවස්ථාවල දී රජුගේ පැත්ත ගැනීම

★ පෘතුගීසි කුලී හමුදාව **(ලකුණු 03 + 03 = 06යි)**

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





06 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 53%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 33%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 18න් ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 33%ක් වන අතර, 22%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.

**ප්‍රශ්නයේ කොටස් හා අනු කොටස්වල පහසුතාව**




**6 ප්‍රශ්නයෙහි කොටස් හා අනු කොටස්**

★ මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 9 අතුරෙන් පහසුතාව වැඩි ම අනු කොටස *(i) C* වන අතර එහි පහසුතාව 88%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(i) B* වන අතර එහි පහසුතාව 36%කි.

PAST PAPERS WIKI

මහනුවර රාජධානියේ වැදගත් දේශපාලන සිදුවීම්, ආර්ථික තොරතුරු හා ඉඩම් භුක්තිය ඔස්සේ එහි අනන්‍යතාව පිළිබඳ දැනුම, අවබෝධය පිරික්සීම සඳහා මෙම ප්‍රශ්නය සකස් කර ඇත. ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 60%කි.

මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති සංඛ්‍යාව 53%කි. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂ ව මෙම ප්‍රශ්නය මධ්‍යස්ථ මට්ටමේ පහසුතාව පෙන්වන අතර, මෙහි *(i)* කොටස *A, B* සහ *C* යනුවෙන් අනු කොටස් තුනකින් යුක්ත ය. ඒ සඳහා ලබා ඇති පහසුතාව පිළිවෙළින් 53%ක්, 36%ක් සහ 88%කි. *(i) B* අනු කොටස අඩු පහසුතාව ලබා ගැනීමට හේතු වී ඇත්තේ උඩරට රාජධානියට සම්බන්ධ රජවරුන් පිළිබඳ දැනුම හා අවබෝධය ශිෂ්‍යයා තුළ අඩු වීම යි.

මෙම ප්‍රශ්නයේ *(ii)* කොටස *A, B, C* සහ *D* යනුවෙන් කොටස් හතරකින් යුක්ත වන අතර, *A* හා *C* අනු කොටස්වල පහසුතාව 50%ට අඩු ය. *B* හා *D* අනු කොටස්වල පහසුතාව 65% ඉක්මවා ඇත. *A* හා *C* අනු කොටස්වලට අඩු පහසුතාව ලබා තිබීමට හේතුව වී ඇත්තේ පිළිතුරු මාරු කොට ලියා තිබීම යි. මෙම තොරතුරු නිශ්චිත ව ශිෂ්‍යයා විසින් තහවුරු කොට ගෙන නැති බව අනාවරණය වේ. මෙම විෂය කරුණු තහවුරු කිරීම සඳහා වගු සටහන් ප්‍රයෝජනයට ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

මෙම ප්‍රශ්නයේ *(iii)* කොටස සඳහා පහසුතාව 68%කි. මෙය පහසුවෙන් පිළිතුරු ලිවීමට හැකි ප්‍රශ්නයක් වුව ද, ප්‍රශ්නයට අදාළ කරුණු සිසුවා දැන සිටිය ද ඒවා විස්තර කිරීමේ හැකියාව ශිෂ්‍යයා තුළ නොවීම ගැටලුවක් වී ඇති බව පෙනේ. ව්‍යුහගත ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට පෙරහුරු පරීක්ෂණ කරවීම ගුරුවරයා විසින් මෙයට පිළියම් ලෙස කළ යුතු ව ඇත.

6 වන ප්‍රශ්නයේ *(iv)* වන කොටස සඳහා පහසුතාව 64%ක් වන අතර, මේ සඳහා ද ඉහත ක්‍රමවේද අනුගමනය කිරීමට ගුරුවරයාට හැකියාව ඇත මීට අමතර ව පන්ති කාමරය තුළ, නියමිත කාලය තුළ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට, අනුහුරු අභ්‍යාසවලට හුරු කිරීමට ශිෂ්‍යයා පුහුණු කරවීම කළ යුතු ය.

**7 ප්‍රශ්නය**

**නිපුණතාව : බ්‍රිතාන්‍ය බලපෑම් හමුවේ උඩරට රාජධානිය තම අනන්‍යතාවය රැක ගැනීම පිළිබඳ තුලනාත්මක අවබෝධය පිරික්සීම**

**7.** (i) බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉන්දියාවේ පිහිටුවනු ලැබූ වෙළෙඳ මධ්‍යස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් යටත් කර ගත් බ්‍රිතාන්‍යයන්ට, මහනුවර රාජධානිය අත්පත් කර ගැනීමට අවශ්‍ය වූයේ ඇයි දැයි කරුණු **දෙකක්** ඇසුරෙන් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව. 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලයක් ඇති වීමට බලපෑ හේතු **තුනක්** සැකෙවින් විස්තර කරන්න.(ලකුණු 06 යි)

**7. (i)** - කල්කටාව
- බොම්බාය
- මදුරාසිය

**(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** - ශ්‍රී ලංකාවේ භෞතික පිහිටීමේ වැදගත්කම
- කුරුඳු ඇතුලු වටිනා වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව

**(ලකුණු 02 × 02 = 04යි)**

PAST PAPERS WIKI

**(iii)**
- රට මැද ස්වාධීන රාජ්‍යයක් පැවතීම මුහුදු බඩ ඉංග්‍රීසි පාලනයට බාධාවක් සේ සැලකීම.
- පහත රට කැරලි ඇතිවූ අවස්ථාවල දී උඩරට රජු ඒවාට සහය දැක්වීම.
- දේශ සීමා ආරක්ෂාවට විශාල මුදලක් වැය කිරීමට සිදුවීම.
- වෙළෙඳ කටයුතුවල දී කඩවත් බදු ගෙවීමට සිදුවීම.
- කොළඹ හා ත්‍රිකුණාමලය අතර ගොඩබිම් සබඳතා පැවැත්වීමේ දී උඩරට රාජ්‍යය බාධාවක් වීම.
- උඩරට රජ වෙනත් යුරෝපා ජාතියකගේ උදව් ලබා ගනිවී යැයි සැක සිතීම.


**(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)**
- අදෘශ්‍යමාන රජකෙනෙකුට පක්ෂපාති වීමට තිබූ අකමැත්ත
- උඩරට ප්‍රභූ පන්තිය නොසලකා හැරීම
- බුදු දහම හා සංස්කෘතිය නොසලකා හැරීම
- බහුතර සිංහල ජනතාවක් විසු වෙල්ලස්ස ප්‍රදේශයට මුස්ලිම් මුහන්දිරම්වරයකු පත් කිරීම

**(ලකුණු 03 + 03 = 06යි)**

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





07 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 78%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 22%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 18න් ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 22%ක් වන අතර, 28%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.

**ප්‍රශ්නයේ කොටස් හා අනු කොටස්වල පහසුතාව**




**7 ප්‍රශ්නයෙහි කොටස් හා අනු කොටස්**

★ මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 4 අතුරෙන් පහසුතාව වැඩි ම අනු කොටස *(ii)* වන අතර එහි පහසුතාව 81%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(i)* වන අතර එහි පහසුතාව 41%කි.

PAST PAPERS WIKI

බ්‍රිතාන්‍ය බලපෑම් හමුවේ උඩරට රාජධානිය තම අනන්‍යතාවය රැක ගැනීම පිළිබඳ තුලනාත්මක අවබෝධය පිරික්සීම සඳහා මෙම ප්‍රශ්නය සකස් කර ඇත.

මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දී ඇති ප්‍රතිශතය 78%කි.

මෙහි *(i)* කොටස සඳහා පහසුතාව 41%කි. සමස්තයක් වශයෙන් ගතහොත් පහසුතාව ප්‍රමාණවත් නොවේ. මෙම කොටසින් ඉන්දියාවේ පිහිටවනු ලැබූ බ්‍රිතාන්‍ය වෙළෙඳ මධ්‍යස්ථාන පිළිබඳ ව අසා ඇතත්, ඒ පිළිබඳ ව පිළිතුරු සැපයීමට අපහසු වී ඇත්තේ සිසුන්ගේ පෙළපොත් පරිහරණයේ දුර්වලතාවය යි. මේ තත්ත්වය මගහරවා ගැනීම සඳහා පාඩම ඉගැන්වීම කරන අතරතුර ම මෙම වෙළෙඳ මධ්‍යස්ථාන සිතියම්වල ලකුණු කොට නම් කිරීමට ගුරුවරයාට සිසුන් පෙළඹවීම කළ හැකි ය. තව ද 10, 11 ශ්‍රේණිවල දී මෙම තොරතුරු තහවුරු කර ගැනීමට පෙළපොත්වල සිතියම් ඇතුළත් නොවීම ද ගැටලුවකි.

මෙම ප්‍රශ්නයේ *(ii)* කොටස සඳහා පහසුතාව 81%කි. මෙය සතුටුදායක තත්ත්වයකි. එයට හේතුව කණිෂ්ඨ ද්විතියික පෙළපොත් මගින් ද අපේක්ෂකයන්ට දැනුම ලැබී තිබීම යි.

මෙම ප්‍රශ්නයේ *(iii)* කොටස සඳහා 45%ක් අඩු පහසුතාව පෙන්නුම් කොට ඇත. මෙයට හේතුව ලෙස පෙන්විය හැක්කේ අපේක්ෂකයා ප්‍රශ්නය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා නොතිබීම යි. මෙම ගැටලුව මග හරවා ගැනීමට නම් පෙළපොතේ සඳහන් කරුණු සුවිශේෂ කොට කරුණු වශයෙන් ලිවීමට සැලැස්වීම කළ හැකි ය. මෙහි දී උඩරට පිහිටීම සහිත ශ්‍රී ලංකා සිතියම් භාවිත කරමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද ගුරුභවතුන්ට අනුගමනය කළ හැකි ය.

මෙහි *(iv)* වන කොටස සඳහා ලබා ඇති පහසුතාව 48%කි. මෙහි දී අපේක්ෂකයන් කරුණු ලියා තිබුණ ද, විස්තර කිරීමේ අඩුපාඩු නිසා ලකුණු ලබා ගැනීමේ ප්‍රතිශතය අඩු වී ඇත. මෙය මගහරවා ගැනීමට නම් වර්ෂ 1818 සහ 1848 නිදහස් සටන් පිළිබඳ ප්‍රධාන කරුණු සංසන්දනාත්මක වගුවකට යොමු කොට පංතියේ ප්‍රදර්ශනය කරවීම සුදුසු ය. තව ද මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සපයන ආකාරය පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම ද ඉතා වැදගත් වේ. මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව සිසුවාගේ දැනුම වර්ධනය කිරීම සඳහා සාකච්ඡා මණ්ඩප, වාද විවාද පැවැත්වීම වඩාත් උචිත යැයි යෝජනා කළ හැකි ය.

PAST PAPERS WIKI

## III කොටස

8 ප්‍රශ්නය

**නිපුණතාව :** **ලෝකයේ විවිධ රටවල් දේශපාලන, ආර්ථික හා මානව අයිතිවාසිකම් දිනා ගැනීමට කළ ප්‍රයත්නයන් හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳ සංසන්දනාත්මක අවබෝධය පිරික්සීම**

**8.** (i) ප්‍රංශ විප්ලවයට බලපෑ මතවාද ඉදිරිපත් කළ දාර්ශනිකයන් **තිදෙනකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති තොරතුරුවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - ඇමෙරිකන් විප්ලවය ඇරඹීමට මුල් වූ සිදුවීම

*B* - නිදහස් ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා

*C* - ප්‍රංශ විප්ලව සමයේ එරට සිටි පාලකයා

*D* - රුසියන් විප්ලවයට නායකත්වය දුන් පුද්ගලයා

(වී.අයි. ලෙනින්, දහසයවන ලුවී, නැපෝලියන් බොනපාට්, බොස්ටන් තේ සාදය, ටෙනිස් පිටියේ දිවුරුම, ජෝර්ජ් වොෂින්ටන්, ඒබ්‍රහම් ලින්කන්, ලියෝන් ට්‍රොට්ස්කි) (ලකුණු 04 යි)

(iii) ප්‍රංශ විප්ලවයෙන් පසු එරට ඇතිවූ වෙනස්කම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) රුසියානු විප්ලවය නිසා එරට ඇතිවූ දේශපාලන හා ආර්ථික වෙනස්කම් එක බැගින් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**8. (i)** - වෝල්ටෙයාර්

- මොන්ටෙස්කියු
- රූසෝ / ජීන් ජැක් රූ÷ **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - බොස්ටන් තේ සාදය

*B* - ජෝර්ජ් වොෂින්ටන්

*C* - දහසයවන ලුවී

*D* - වී.අයි. ලෙනින් **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)** ★ ප්‍රංශ රාජාණ්ඩුක්‍රමය බිඳ වැටීම

★ ප්‍රංශය තුළ සමුහාණ්ඩු පාලනයක් ඇති වීම

★ ප්‍රංශ ගොවි ජනතාවට සහන ලැබීම

★ ප්‍රංශයේ අස්ථාවර දේශපාලන ක්‍රමයක් බිහිවීම

★ ක්‍රි.ව. 1791 දී මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයක් එළි දැක්වීම **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** ★ **දේශපාලන වෙනස්කම්**


- සාර් පාලනය බිඳ වැටීම
- සමාජවාදි සමුහාණ්ඩුවක් ඇති වීම
- නව නිලධාරි පැලන්තියක් බිහි වීම
- රුසියාව, සෝවියට් සමාජවාදි සමුහාණ්ඩු සංගමය යන නමින් හැඳින්වීම

★ **ආර්ථික වෙනස්කම්**

- පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කිරීම
- කුඩා ගොවිපළවල්, විශාල සමුහ ගොවිපළවල් බවට පත් කිරීම
- කර්මාන්තශාලා, බැංකු, ගමනාගමනය ජනසතු කිරීම
- පෞද්ගලික ව්‍යවසාය වෙනුවට පොදු ව්‍යවසාය පිළිගැනීම **(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI

**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය

08 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 33%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 54%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 12%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 9%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 18න් ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 9%ක් වන අතර, 54%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රශ්නයේ කොටස් හා අනු කොටස්වල පහසුතාව

- ⋆ මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 7 අතුරෙන් පහසුතාව වැඩි ම අනු කොටස *(ii) A* වන අතර එහි පහසුතාව 79%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(iv)* වන අතර එහි පහසුතාව 20%කි.

ලෝකයේ විවිධ රටවල් දේශපාලන, ආර්ථික හා මානව අයිතිවාසිකම් දිනාගැනීමට කළ ප්‍රයත්නයන් හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳ සංසන්දනාත්මක අවබෝධයක් ලබා ගැනීම සඳහා මෙම ප්‍රශ්නය සකසා ඇත. මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රමාණය 33%කි.

මෙම ප්‍රශ්නයේ *(i)* කොටසේ පහසුතාව 36%ක් වැනි අඩු ප්‍රතිශතයකි.මෙයට හේතුව අපේක්ෂකයන්ට ප්‍රංශ විප්ලවයට සම්බන්ධ පුද්ගල නාම ව්‍යවහාරයේ දී නුහුරු වීම විය හැකි ය. ඒ සඳහා එක් එක් විප්ලව සඳහා වැදගත් පුද්ගලයන් සම්බන්ධ පින්තූර සහ නාම පංතියේ ප්‍රදර්ශනය කළ හැකි ය.

මෙම ප්‍රශ්නයේ *(ii)* කොටස *A, B, C* සහ *D* වශයෙන් අනු කොටස් හතරකට බෙදා ඇත. එහි පහසුතාව අනුපිළිවෙළින් 79%ක්, 61%ක්, 70%ක් සහ 55%ක් වශයෙනි. ප්‍රශ්නයට අපේක්ෂිත පිළිතුර වරහන් තුළින් තෝරා ලිවීමට උපදෙස් දී ඇති නිසා අපේක්ෂකයන්ට නිවැරදි පිළිතුරු සැපයීමට පහසු වී ඇත.

PAST PAPERS WIKI

| |
|---|
| *(iii)* කොටස සඳහා පහසුතාව 24%කි. ප්‍රංශ විප්ලවයට සම්බන්ධ ව පෙළපොතේ සමාජයීය, දේශපාලන, ආර්ථික ක්ෂේත්‍ර යටතේ තොරතුරු විස්තර තිබුණ ද, එම තොරතුරු උපුටා දැක්වීමට අපොහොසත් වී ඇත. පෙළපොත පරිහරණයේ දුර්වලතාව හා තොරතුරු ඉදිරිපත් කිරීමේ දුර්වලතාව මින් ප්‍රදර්ශනය කෙරේ.<br><br>මෙම ප්‍රශ්නයේ *(iv)* කොටස සඳහා 20%ක පහසුතාව ලබා ඇත. සමස්ත ප්‍රශ්නයේ අඩු ම පහසුතාව ලබා ඇති කොටස වන්නේ ද මෙයයි. ඊට හේතුව ප්‍රශ්නයෙන් අසා ඇති දේශපාලන හා ආර්ථික වෙනස්කම් සුවිශේෂ ව වෙන් කොට දැක්වීමට අපේක්ෂකයන් අපොහොසත් වීම යි. මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු ලියා පුහුණුවක් ලබා දීමෙන් මීට වඩා පහසුතාව ඉහළ නංවා ගැනීමට උදව්වක් වනු ඇත. |

**9 ප්‍රශ්නය**

**නිපුණතාව : ලෝක බල තරගයේ ස්වභාවය හා එහි ප්‍රතිඵල පිළිබඳ අවබෝධය පිරික්සීම**

**9.** (i) යටත් විජිත ඇති කර ගත් යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A*, *B*, *C* හා *D* වලින් දැක්වෙන තොරතුරුවලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා, අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - කුඩා රාජ්‍ය කිහිපයක් එකතු කොට ජර්මනිය නමින් රටක් බිහි කළ තැනැත්තා

*B* - යටත් විජිත ඇති කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ ජර්මන් අධිරාජයා

*C* - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ දී මිත්‍ර පක්ෂයට නායකත්වය දුන් බ්‍රිතාන්‍ය අගමැතිවරයා

*D* - දෙවන ලෝක මහා සංග්‍රාමය අවසානයේ දී කොන්දේසි විරහිතව යටත් වීමේ ගිවිසුමට අත්සන් කළ ජපන් අධිරාජයා

(හිරෝහිතෝ, මුට්සුහිතෝ, වින්ස්ටන් චර්චිල්, ලොයිඩ් ජෝර්ජ්, දෙවන විලියම් කයිසර්, ඔටෝ වොන් බිස්මාර්ක්, ඇඩොල්ෆ් හිට්ලර්, ජෝෂප් ස්ටාලින්) (ලකුණු 04 යි)

(iii) ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල **තුනක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**9. (i)** - පෘතුගාලය
- ස්පාඤ්ඤය
- ඕලන්දය / නෙදර්ලන්තය
- බ්‍රිතාන්‍ය / එක්සත් රාජධානිය / එංගලන්තය
- ප්‍රංශය
- බෙල්ජියම **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - ඔටෝ වොන් බිස්මාර්ක් *B* - දෙවන විලියම් කයිසර්

*C* - වින්ස්ටන් චර්චිල් *D* - හිරෝහිතෝ **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)** ★ ආර්ථික සම්බාධක පැනවීම

★ සාම සාධක හමුදා යැවීම

★ න්‍යෂ්ටික අවි නිෂ්පාදනය හා භාවිතය සීමා කිරීම


★ සාම සාකච්ඡා සඳහා යොමු කිරීම **(ලකුණු 02 + 03 = 05යි)**

PAST PAPERS WIKI

**(iv)** ★ අක්ෂ පිල පරාජයට පත්වීම
★ සාම සාධක හමුදා යැවීම
★ යටත් විජිතයන්ට නිදහස ලැබීම
★ ලෝක බලතුලනය වෙනස් වීම
★ එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම
★ නව රාජ්‍ය බිහිවීම
★ මාර්ෂල් සැලැස්ම ආරම්භ කිරීම
★ නිරවි යුද්ධය ආරම්භ වීම
★ පරමාණු බෝම්බ හෙලීම තුළින් අනාගත පරම්පරා ගණනාවක් අහිතකර බලපෑම්වලට ලක්වීම
★ නොබැඳි ජාතීන්ගේ සංවිධානය බිහිවීම
★ ජර්මනිය දෙකඩ වීම **(ලකුණු 03 + 03 = 06යි)**

**9 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





09 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 65%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ. ඉන් ලකුණු ලබාගෙන ඇති ප්‍රතිශතයන් පහත පරිදි දැක්විය හැකි ය.

ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 20%ක් ද වේ.

මෙම ප්‍රශ්නය සඳහා ලබා දී ඇති ලකුණු 18න් ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 20%ක් වන අතර, 28%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.

**ප්‍රශ්නයේ කොටස් හා අනු කොටස්වල පහසුතාව**




**9 ප්‍රශ්නයෙහි කොටස් හා අනු කොටස්**

★ මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 7 අතුරෙන් පහසුතාව වැඩි ම අනු කොටස *(ii) A* වන අතර එහි පහසුතාව 70%කි. එසේම පහසුතාව අඩු ම කොටස *(iii)* වන අතර එහි පහසුතාව 40%කි.

PAST PAPERS WIKI

ලෝක බල තරගයේ ස්වභාවය හා එහි ප්‍රතිඵල පිළිබඳ අවබෝධය පිරික්සීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ. මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 65%ක සංඛ්‍යාවකි. ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 57.57%කි. ප්‍රශ්න පත්‍රයේ III කොටසේ ලෝක ඉතිහාසය සම්බන්ධයෙන් ජනප්‍රිය ප්‍රශ්නය යි.

මෙම ප්‍රශ්නයේ *(i)* කොටසෙහි පහසුතාව 64%කි. මෙයින් අසා ඇත්තේ යටත් විජිත ඇති කරගත් රටවල් තුනක් සම්බන්ධව යි. අවම වශයෙන් ශ්‍රී ලංකාව යටත් කරගත් බටහිර රටවල් තුන නම් කළ ද මෙයට 100%ක ලකුණක් ලබා ගැනීමට හැකියාව තිබුණ ද අයදුම්කරුවන් ඊට අපොහොසත් වී ඇත. විෂය කරුණු සම්බන්ධව සිසු  අවධානය යොමු වීමේ අඩු බව මින් අනාවරණය වේ.


මෙම ප්‍රශ්නයේ *(ii)* කොටස *A, B, C* සහ *D* යනුවෙන් අනු කොටස් හතර සඳහා පිළිවෙළින් 70%, 51%, 60% හා 64% බැගින් වේ. සමස්ත පහසුතාව 61.25%ක් වේ. ඉහළ පහසුතාව ලබා ගැනීම සඳහා වරහන් තුළ පිළිතුරු ලබා දී තිබීම හේතුවන්නට ඇත. එය අයදුම්කරුවන්ට පිළිතුරු නිවැරදි ව තෝරා ගැනීමට රුකුලකි.

මෙම ප්‍රශ්නයේ *(iii)* කොටසේ පහසුතාව 40%කි. ප්‍රශ්නයේ අඩු ම පහසුතාව ලබා ඇත්තේ මෙම කොටස යි. මෙයින් අපේක්ෂා කර ඇත්තේ ලෝක සාමය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග යි. කාලීන ප්‍රශ්නයක් වන මේ පිළිබඳ ව සිසුන්ගේ දැනුම මීට වඩා උසස් විය යුතු ය. මෙයට හේතු වී ඇත්තේ අපේක්ෂකයා පෙළ පොත පිළිබඳ මෙන්ම එදිනෙදා ලෝකයේ සිදුවන සිදුවීම් පිළිබඳ ව අවධානය යොමු නොකිරීම යි.

මෙම ප්‍රශ්නයේ *(iv)* කොටසෙහි පහසුතාව 54%කි. මීට වඩා ඉහළ පහසුතාව ලබා ගත හැකි ව තිබුණි. මෙම ප්‍රතිඵලය ගැනීමට හේතු වී ඇත්තේ කරුණු ලියා තිබුණත් විස්තර කිරීමේ හැකියාවේ අඩුපාඩු අපේක්ෂකයන් තුළ තිබීම යි. මෙයට පිළියම් වශයෙන් මෙවැනි රචනා ප්‍රශ්න පිළිබඳ ව පිළිතුරු ලිවීමට ගුරුභවතුන්ගේ අධීක්ෂණය යටතේ කාල පරිච්ඡේදය තුළම පෙරහුරු ලබා දීම සුදුසු යැයි යෝජනා කළ හැකි ය.

PAST PAPERS WIKI

**2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




I කොටස

පළමු කොටසට පළමු ප්‍රශ්නය පමණක් අයත් වන අතර, එය අනිවාර්ය වේ. මෙම ප්‍රශ්නය සකස් වී ඇත්තේ (අ) *(i), (ii)* හා (ආ) *(i), (ii)* හා *(iii)* යන අනුකොටස්වලිනි. මෙම ප්‍රශ්නයට ලකුණු 30ක් හිමි වේ. ශ්‍රී ලංකා ඉතිහාසයට අදාළ තොරතුරු නියෝජනය වන්නේ (අ) *(i)* හා (ආ) *(i) B* හා *C* යන අනු කොටස්වල හා (ආ) කොටසේ *(ii) 1, 2, 3, 4* හා (ආ) *(iii), 1, 2, 3* සහ *4* යන අනු කොටස්වලින් ය. ලෝක ඉතිහාසයට අදාළ තොරතුරු නියෝජනය වන්නේ (අ) *(ii)*, (ආ) *(i) A* හා *D* යන අනු කොටස්වලින් ය. පළමු ප්‍රශ්නයේ පහසුතාව ශ්‍රී ලංකා ඉතිහාසයට 44%ක් හා ලෝක ඉතිහාසයට 40%ක් වේ.

ශ්‍රී ලංකා ඉතිහාසය හා සම්බන්ධ ප්‍රශ්න අතරින් වැඩි ම පහසුතාව දක්වා ඇත්තේ (ආ) කොටසේ *(ii) (i)* අනු කොටසට ය. එය 88%කි. එයින් විමසා බැලෙන්නේ (මහා පරාක්‍රමබාහු රජතුමාගේ උපත හා සම්බන්ධ දැදිගම කොටවෙහෙරෙන් හමු වූ) දැදිගම ඇත් පහන හා සම්බන්ධ තොරතුරු ය. රූපය දැකීමෙන් ම පිළිතුර ලිවීමට පහසු වීම වැඩි පහසුතාව හිමි කර ගැනීමට හේතු වී ඇත.

ශ්‍රී ලංකා ඉතිහාසය කොටසේ අඩු ම පහසුතාව හිමිකරගෙන ඇත්තේ (ආ) *(iii) 4* අනු කොටසට ය. මෙහි පහසුතාව 30%කි. මෙයින් විමසා බැලෙන්නේ පොළොන්නරු යුගයට අයත් චෝල වාස්තු විද්‍යා ශෛලියට අයත් *(ii)* ශිව දේවාලය සම්බන්ධ තොරතුරු යි. මෙහි දී මෙකල සිටි චෝල පාලකයන් හා ජාතිය පිළිබඳ ඉහළ දැනුමක් නොලැබී තිබීම ද අඩු පහසුතාව ලබා ගැනීමට හේතු වී ඇත. තව ද පින්තූරය පිළිබඳ පමණක් අවධානය යොමු වීම ද හේතුවකි.

ලෝක ඉතිහාසය කොටසේ අඩු ම පහසුතාව හිමි කර ගන්නේ (අ) *(ii)* ලෝක සිතියම් කොටසට ය. මෙහි පහසුතාව 36%කි. මෙහි දී විමසිල්ලෙන් බලන විට ශ්‍රී ලංකා සිතියම් ලකුණු කිරීමට වඩා වැඩි පහසුතාව ලෝක සිතියම ලබා ගෙන ඇත.

PAST PAPERS WIKI

ශ්‍රී ලංකා හා ලෝක සිතියම් ලකුණු කිරීම සම්බන්ධ ව පහසුතාව මෙම කොටස් දෙකෙහි ම අඩු අගයක් ගනී. සිතියම් ලකුණු කිරීමේ දී සිතියම් විද්‍යාවට අදාළ මූලික සිද්ධාන්ත අනුගමනය නොකිරීමත්, අභ්‍යාස කිරීමේ දී දරුවන් අවශ්‍ය සම්පත් සපයා නොගැනීමත්, පාඩම් සම්බන්ධ සිතියම් අවශ්‍යතාවල දී ගුරුවරුන් සිතියම් භාවිතා නොකිරීමත් පොදු දුර්වලතා වේ. මෙම දුර්වලතා අවම කර ගැනීමට 10 සහ 11 ශ්‍රේණි පෙළපොත්වල සෑම ඒකකයක් අවසානයේ ම ශ්‍රී ලංකාවේ හෝ ලෝකයේ ඓතිහාසික ස්ථාන ලකුණු කරවීමට ගුරුවරයාගේ මග පෙන්වීම අවශ්‍ය වේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකා හා ලෝක සිතියම් භාවිතා කිරීම අත්‍යාවශ්‍ය බව පෙනී යයි.

ශ්‍රී ලංකා සිතියම් ලකුණු කිරීමේ දී ගංගා සහිත ශ්‍රී ලංකා සිතියම්වල පමණක් අභ්‍යාස කරවීම තුළින් ශිෂ්‍යයන් සිතියම් තුළ ස්ථාන නිවැරදි ව ලකුණු කිරීමේ කුසලතාව වැඩි දියුණු කර ගත හැකි බව ද යෝජනා කළ හැකි ය.

ශ්‍රී ලංකා හා ලෝක සිතියම් ලකුණු කිරීම අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක කිරීම ද වැදගත් ය. සෑම පංති කාමරයක ම ශ්‍රී ලංකා හා ලෝක සිතියම් ප්‍රදර්ශනය කිරීම ද ශිෂ්‍යයාට මෙන්ම ගුරුවරයාට ද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැදගත් වනු ඇත.

10 සහ 11 ශ්‍රේණිවලට අදාළ පින්තූර සියල්ල ම සපයාගෙන ඊට සම්බන්ධ වැදගත් කරුණු සකස් කොට සිසුන්ට පරිශීලනය කිරීමට යොමු කිරීම ද කළ හැක.

## II කොටස

ශ්‍රී ලංකා ඉතිහාසයට අදාළ ව පහසුතාව 51%කි. මෙම කොටසේ ප්‍රශ්න 06ක් ඇත. පිළිතුරු සැපයිය යුත්තේ ඉන් ප්‍රශ්න 04කට පමණි. මෙහි දී ප්‍රශ්න අංක 2 සිට 7 දක්වා පහසුතාව පිළිවෙළින් 93%ක්, 93%ක්, 59%ක්, 20%ක්, 53%ක් හා 78%ක් ආදි වශයෙනි. මේ අතරින් ප්‍රශ්න අංක 02 හා 03 වැඩි තෝරා ගැනීමක් පෙන්නුම් කරයි. මෙහි දී 2 ප්‍රශ්නයෙන් විමසා බැලෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයන්ගේ තොරතුරු හා සම්බන්ධව ය. මෙහි දී මෙම තොරතුරු හා සම්බන්ධ පරිසර කලාප, අභිචාර විධි හා තාක්ෂණ දැනුම පිළිබඳ ව අවබෝධය පිරික්සා බැලේ. සරල බව, වැඩි අවධානය යොමු වීම සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රවල මෙවැනි ප්‍රශ්න ඇතුළත් වී තිබීම, පිළිතුරු සපයා තිබීම වැනි හේතු ද බලපා ඇත. එසේ ම 2 වන ප්‍රශ්නය හා 3 වැනි ප්‍රශ්නය සමාන පහසුතාව ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය මගින් විමසා බැලෙන්නේ විවිධ සමාජ ස්ථරවල පුද්ගලයන්ගේ තනතුරු නාම රජතුමාගේ සේවාවන් හා කාර්යයන් පිළිබඳ යි. අපේක්ෂකයන් වැඩි දෙනෙක් ප්‍රශ්න දෙකම තෝරාගෙන ඇතත් 3 ප්‍රශ්නය සඳහා ඉහළ පහසුතාවක් ලබා ගැනීමට හේතු වී ඇත්තේ මෙම ප්‍රශ්නයේ සෑම අනු කොටසක් ම පිළිතුරු සැපයීමට පහසුවන සේ සකසා තිබීම යි. මෙම කොටසින් අඩු ම තෝරා ගැනීම සිදු කොට ඇත්තේ 5 වන ප්‍රශ්නය යි. එය 20%කි. මෙම ප්‍රශ්නයෙන් රජරට, මලය රට, මායා රට හා හයවන පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය ඇගයීමේ හැකියාව පිරික්සා බැලේ. මේ ප්‍රශ්නය තෝරා ගැනීම සම්බන්ධ ව පිරික්සීමේ දී මීට වඩා පහසු ප්‍රශ්න තිබීමත්, ඒවා තෝරා ගැනීමට සිසුන් යොමු වීමත් දැක්විය හැක. මෙහි දී ප්‍රශ්නයේ ඇතැම් කොටස් පහසු වුවත්, වැඩි කොටසක් පිළිතුරු සැපයීමට අපහසුවීම ද බලපා ඇත.

ශ්‍රී ලංකා ඉතිහාසය පිළිබඳ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය උදෙසා සෑම පාඩම් ඒකකයක් අවසානයේ ම ප්‍රශ්න හා උත්තර ඇතුළත් පොතක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කිරීම වැදගත් ය. තව ද සෑම ප්‍රශ්නයක ම 3 සහ 4 වන කොටස්වලට පිළිතුරු ලිවීම සඳහා ගුරු අධීක්ෂණය යටතේ නිශ්චිත කාල සීමාවක් තුළ සිසුන් හුරු කරවීම සහ ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳ ගුරුවරයා සොයා බැලීම නිරන්තරයෙන් කළ යුතු ය.

තව ද වර්ෂයකට වරක්වත් ඉතිහාසය විෂය සම්බන්ධ ප්‍රදර්ශනයක් පාසල් මට්ටමින් පැවැත්වීම තුළින් ක්‍රියාකාරී ඉගෙනුම් අවස්ථා ලබා දිය හැකි ය.

PAST PAPERS WIKI

III කොටස

ලෝක ඉතිහාසය කොටසේ පහසුතාවය 44%කි. එහි ප්‍රශ්න දෙකකි. 08 සහ 09 ප්‍රශ්න ඊට අයත් වේ. ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය අනුව 08 වන ප්‍රශ්නය 33%ක් වන අතර, 9 වන ප්‍රශ්නය 65%ක් ද වේ. ඒ අනුව වැඩි ම තේරීම වන්නේ 9 වන ප්‍රශ්නය යි. අඩු තේරීමට ලක්ව ඇති 8 වන ප්‍රශ්නයෙන් ''ලෝකයේ විවිධ රටවල දේශපාලන, ආර්ථික හා මානව අයිතිවාසිකම් දිනාගැනීමට කළ ප්‍රයත්නයන් හා ඒවායේ ප්‍රතිඵල විමසා බැලේ. මෙම ප්‍රශ්නය අඩුවෙන් තෝරා ගැනීමට හේතු වී ඇත්තේ විප්ලව කීපයක ම තොරතුරු පිළිබඳ ව නිවැරදි තොරතුරු දැක්වීම අපේක්ෂකයාට ගැටලුවක් වීම හා අපහසුවීම ය. 9 වන ප්‍රශ්නයෙන් විමසා බැලෙන්නේ ලෝක බල තරගයේ ස්වභාවය හා එහි ප්‍රතිඵල පිළිබඳ අවබෝධය යි. 8 වන ප්‍රශ්නයට සාපේක්ෂව මෙය ජනප්‍රිය මාතෘකාවක් වීම මීට හේතු වී ඇත. එසේම සෑම කොටසකට ම ඉහළ පහසුතාවක් ලබා ගැනීම ද විශේෂ ලක්ෂණයකි. ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයෙන් ද, ජනමාධ්‍යවලින් ද මේ පිළිබඳ වැඩි අවබෝධයක් ලබා තිබීම ද හේතුවකි.

ලෝක ඉතිහාසයට අයත් පාඩම් ඒකක 4 සඳහා අවශ්‍ය ඉගෙනුම් උපකරණ අන්තර්ජාලයෙන් සපයා ගත හැක. මෙම කරුණු ඇතුලත් වීඩියෝ පට දරුවන්ට ප්‍රදර්ශනය කිරීමෙන් මෙම ඒකක සම්බන්ධ විෂය කරුණු පහසුවෙන් ග්‍රහණය කර ගැනීමට හැකිවනු ඇත. තව ද මෙය දරුවන්ට විනෝදාත්මක වැඩසටහනක් ද වනු ඇත.

PAST PAPERS WIKI

## III කොටස

**3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

**3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

**පොදු උපදෙස් :**

★ ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය

★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගත යුතු ය. තව ද පැහැදිලි ව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතු ය

★ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය

★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය

★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය

★ ප්‍රශ්න අංක, කොටස් අංක හා අනුකොටස් අංක නිවැරදිව ලිවිය යුතු ය

★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය

★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතු ය

★ II පත්‍රයේ එකිනෙක කොටස්වලින් නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයීමට කාලය මිඩංගු කළ යුතු අතර, වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතු ය

**විශේෂ උපදෙස් :**

★ සිතියම් ලකුණු කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

- නගර ලකුණු කිරීමේ දී නිවැරදි ස්ථානය පැහැදිලිව තිත් ලකුණක් යොදා ලකුණු කර නම් කිරීම
- වැව් ලකුණු කිරීමේ දී නිවැරදි වැව තෝරාගෙන මායිම් තුළ ප්‍රදේශය අඳුරු කර නම් කිරීම
- ගංගා සහ කඳුවැටි ලකුණු කිරීමේ දී නිවැරදිව හඳුනාගත හැකිවන ලෙස නම් කිරීම

★ අසා ඇති ප්‍රශ්නවලට උචිත පරිදි පිළිතුරු ඉදිරිපත් කිරීම

★ කරුණු දැක්වීම හා ඒවා පැහැදිලි කිරීම, විස්තර කිරීම හෝ සනාථ කිරීම අනුව ප්‍රශ්නවල ලකුණු බර තබා ඇති බව තේරුම් ගැනීම

★ ව්‍යුහගත රචනා වර්ගයේදී නිදසුන් හා සාධක ඉදිරිපත් කළ යුතු වීම

★ පිළිතුරු ලිවීමේ දී ඇගයීමේ පහසුව සඳහා අවශ්‍ය තැන්හි ඡේද වෙන් කළ යුතු වීම

★ අනුපිළිවෙළින් පිළිතුරු නම් කිරීම කළ යුතු අවස්ථාවලදී ඒ සඳහා සැළකිලිමත් වීම

PAST PAPERS
WIKI

**විදුහල්පතිවරුන් උදෙසා උපදෙස් :**

- ★ විෂය සංවර්ධනය සඳහා වාර්ෂික සැලසුම් සකස් කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මගපෙන්වීම හා අනුග්‍රහය තවදුරටත් පුළුල් අයුරින් ලබා දිය යුතු ය.
- ★ විෂය සංවර්ධනය සඳහා අභ්‍යන්තර ඇගයීම් හා අධීක්ෂණ ක්‍රියාවලිය යාවත්කාලීනව සැලසුම් කර සංවිධානාත්මකව පවත්වාගෙන යා යුතු ය.
- ★ ගුරුවරුන්ගේ විෂය සංවර්ධනය සඳහා කොට්ඨාස, කලාප හා අමාත්‍යාංශ මට්ටමින් පවත්වන වැඩමුළු සඳහා සෑම ගුරුභවතකු ම සහභාගී කරවීමට කාරුණික විය යුතු ය.
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.
- ★ කාලසටහන් ලබා දීමේ දී විෂය ප්‍රවීණතාවය සහිත ගුරුභවතුන්ට මූලිකත්වය ලබා දීම අත්‍යාවශ්‍ය ය.
- ★ ගුරුභවතුන්ට තම විෂය පිළිබඳ වගකීම පැවරෙන පරිදි විෂය මාලාව ක්‍රියාත්මක කිරීම අවස්ථාව ලබා දීම. (එක් ශිෂ්‍ය කණ්ඩායමක් වසර කීපයක් එක් ගුරුභවතකුගේ විෂය භාරකාරත්වයට සම්බන්ධ කිරීම)
- ★ වාර්ෂිකව ත්‍යාග, සහතිකපත් ලබා දීම වැනි ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය තවදුරටත් යොමු කරවීම
- ★ ඉතිහාසය විෂය සංවර්ධනය සඳහා පාසලේ පවතින සම්පත්වලට ගැළපෙන පරිදි ස්ථානයක්, උපකරණ, ආශ්‍රිත ග්‍රන්ථ, සිතියම් ලබා දීම ආදි අවශ්‍ය පියවර ගැනීමට තවදුරටත් කාරුණික විය යුතු ය.
- ★ විවිධ විෂයයන් සඳහා පුහුණුව හෝ පත්වීම් ලැබූ ගුරුභවතුන්ගේ කාල සටහන සම්පූර්ණ කිරීමේ අපේක්ෂාවෙන් ඉතිහාසය විෂය ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් සඳහා යොමු නොකළ යුතු ය. එය විෂයට මෙන්ම සිසුන්ට ද කරන බලවත් හානියකි.
- ★ විෂයයට ඇති කාලච්ඡේද 03 ප්‍රමාණවත් නොවන නිසා, තවත් කාලච්ඡේදයක් ලබා දීම. (මේ සඳහා ව්‍යාපෘතිවල කාලච්ඡේද ලබා දීම ඇතැම් පාසල්වල විදුහල්පතිවරුන් දැනටමත් ක්‍රියාත්මක කර ඇත.)

**විෂයභාර ගුරුභවතුන්ට උපදෙස් :**

- ★ අ.පො.ස.(සා.පෙළ)ට නියමිත විෂය නිර්දේශය ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කරමින් එය ද ඉගෙනුම් උපකරණයක් වශයෙන් භාවිත කිරීමට වඩාත් අවධානය යොමු කරවීම.
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ ඒ නිපුණතාවයන්ට හා විෂය සන්ධාරයට අදාළ යෝග්‍යතම ඉගෙනුම් ක්‍රමවේද තෝරා ගත යුතු ය.
- ★ හැකිතාක් දුරට ඉගෙනුම් ආධාරක තුළින් සංකල්ප සාධනයට අවස්ථා සලසා දිය යුතු ය.
- ★ අ.පො.ස.(සා.පෙළ) විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් සකස් කොට ඇති ඇගයීම් වාර්තා පරිශීලනය කොට එය විෂය සංවර්ධනය සඳහා යොදා ගත යුතු ය.
- ★ අඩු සාධන මට්ටම් පෙන්නුම් කෙරෙන විෂය කොටස් සඳහා සාධන මට්ටම සංවර්ධනය කිරීමට විශේෂ වැඩමුළු, කඳවුරු, ව්‍යාපෘති, පැවරුම් වැනි ක්‍රියාකාරකම් යොදා ගත හැකිය.
- ★ එක් දිනක අධ්‍යාපන චාරිකා වෙනුවට (සමාන්තර පන්ති වෙන්කර ගෙන හෝ) දින දෙකකටවත් යා හැකි චාරිකා සංවිධානය කිරීම වඩා යෝග්‍ය වේ. (දරුවා වැය කරන මුදලටත් සාධාරණයක් වීමටත්, කාර්ය පත්‍රිකාව ලබා දීමට කටයුතු කිරීමෙන් ස්ථාන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත් පහසු වේ.)
- ★ ශ්‍රී ලංකා සිතියම් අභ්‍යාස ලබා දීමේ දී හා අනුහුරු පරීක්ෂණවල දී ප්‍රශ්න පත්‍රය සමග ලබා දෙන සිතියම මුද්‍රණය කර ලබා දීමට කටයුතු කිරීම.

PAST PAPERS WIKI

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

★ ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලිය තුළින් ප්‍රතිඵල සංවර්ධනය සඳහා

- ඉගෙනුම් ආධාරක භාවිත කිරීම
- විෂය ක්‍රියාකාරකම් ප්‍රබෝධ ජනක අයුරින් සංවිධානය කිරීම
- සැලසුම් කරන ලද ක්ෂෙත්‍ර චාරිකා සංවිධානය කිරීම
- විශේෂයෙන්ම පෙළපොත පරිහරණය සඳහා යොමු කිරීම
- සිසු නිර්මාණ (විෂයයට අදාළ) පන්තියේ ප්‍රදර්ශනය කිරීම (බිත්ති පුවත්පත්, සඟරා, ප්‍රහේලිකා, කෙටි ප්‍රශ්න හා පිළිතුරු සංග්‍රහ සකස් කිරීම)
- ඉතිහාසය විෂයය සඳහා කාමරයක්/ ප්‍රදේශයක් වෙන් කර සංවර්ධනය කිරීම
- විවෘත ග්‍රන්ථ පරීක්ෂණවලට යොමුකොට කරුණු ගවේෂණය කිරීම
- ආධාරක වශයෙන් නිවැරදි සිතියම් භාවිත කිරීම හා සිතියම් සංග්‍රහ සකස් කරවීම
- පිළිතුරු ලිවීමේ දී කරුණු සංවිධානය, ප්‍රගුණ කිරීමේ අභ්‍යාස කරවීම
- ගමෙහි/ ප්‍රදේශයෙහි/ රටෙහි ඓතිහාසික ස්ථාන හා සිදුවීම් ජනප්‍රවාද ඇසුරෙන් සොයා බැලීමට යොමු කිරීම
- රූපවාහිනී/ ගුවන්විදුලි/ පුවත්පත්වල අධ්‍යාපනික වැඩසටහන් සාකච්ඡා සහ ලිපිවලින් තොරතුරු රැස් කිරීමට යොමු කිරීම.
  (නිද - මහා සංචාරේ, වන්දනා, සති අන්ත පුවත්පත්වල පළවන විශේෂ අතිරේක)
- ප්‍රවීන දේශකයන්ගේ උදව් උපකාර ලබා ගැනීම
- බුද්ධි මණ්ඩල සාකච්ඡා, විවිධ පාසල් තුළ හා පාසල් අතර සංවිධානය කිරීම

PAST PAPERS
WIKI